**ශීර්ෂය 126 - අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුනි 30 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශනශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

#### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 198,586 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 60,511 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් රු.මිලියන 138,075 ක හෙවත් සියයට 69.53 ක ඉතිරිවීම් තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 167,250 | 45,396 | 121,854 | 72.86 |
| මූලධන | 31,336 | 15,115 | 16,221 | 51.77 |
| එකතුව | 198,586 | 60,511 | 138,075 | 69.53 |

### 2.2 අත්තිකාරම් ගිණුම්

#### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 12601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 1,600 | 1,115 | 950 | 969 | 3,000 | 1,950 |

**2.3 පොදු තැන්පත් ගිණුම්**
**-----------------------**

අමාත්‍යාංශය යටතේ වන 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 939.5 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය<br>------------------------- | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය<br>--------------- |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0006/0064/000 | 0.1 |
| 6000/0000/00/0001/0128/000 | 24.4 |
| 6000/0000/00/0002/0180/000 | 13.6 |
| 6000/0000/00/0013/0139/000 | 109.5 |
| 6000/0000/00/0016/0012/000 | 791.9<br>---------- |
| එකතුව | 939.5<br>===== |

**2.4 විගණන නිරීක්ෂණය**
**----------------------**

අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**
**---------------------------------------------**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**
**-------------------------------------------**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
| --- | --- | --- |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 18 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| පරිගණක, උපාංගහාමෘදුකාංගපිළිබඳස්ථාවරවත්කම්ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වානොතිබුණි. |
| ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වානොතිබුණි. |

**3.2 විගණන සාක්ෂි නොවීම**

වේයන්ගොඩ සියනෑ විද්‍යාපීඨයපිහිටිඅක්කර 85 කින්සමන්විතඉඩමේඅයිතියතහවුරුකිරීමසඳහාවුලිඛිතසාක්ෂිනොතිබුණි.

3.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම්25කට 2017 අගෝස්තු 30 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.7,413,041,192 ක් වී තිබුණි.

**3.4 විසර්ජන ගිණුම**

**3.4.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය 2015 දෙසැම්බර් 14 දිනැති අංක 08/2015 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව 2016 වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව පදනම් කරගෙන අවශ්‍ය අග්‍රිම සීමාව සඳහන් කර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබුණු සීමාවන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අනුමත

කර තිබුණි. අනුමත කළ සීමාවන් අනුව ඒ ඒ මාසවල අපේක්ෂා කළ පරිදි අමාත්‍යාංශයවෙත භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අග්‍රිම නිකුත් කර නොතිබීම හා  අවශ්‍යතාව හඳුනාගැනීමෙන් තොරව ප්‍රතිපාදන සළසා ගෙන තිබීම හේතුවෙන් පහත සඳහන් අයවැය විචලනයන් නිරීක්ෂණය විය.

i. මූලධන වැය විෂයයන් 15ක් සඳහා සලසා තිබුණු රු.543,507,652ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

ii. මූලධන වැය විෂයයන් 54 ක් සඳහා  අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.14,385,510,890 ක් වූ අතර,  එය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 40 සිට සියයට 99 අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

iii. පුනරාවර්තන වැය විෂයයන් 09ක් සඳහා වෙන් කරන ලද ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.121,354,335,000 ක මුදල මුළුමණින්ම ඉතිරිවී තිබුණි.

(ආ) අමාත්‍යාංශය වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේදී ඇස්තමේන්තුව තුල ඇතුලත් කර නොතිබුණු නමුත්, 2016 වාර්ෂික ඇස්තමේන්තුවේ අමාත්‍යාංශයේ වැය විෂය 126-2-4-1-1407 යටතේ රාජ්‍ය ආයෝජන පවත්වාගෙන යාමේ පිරිවැය ඉඩම් හා ගොඩනැගිලි ලෙසරු. 121,352,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. නාමික අගයක් ලෙස දක්වා ඇති නිසා ප්‍රතිපාදන නිදහස් කිරීමක් සිදුනොවන හෙයින් එය වියදමක් ලෙස ගිණුම්ගත කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශය  වෙත දන්වා එවා තිබුණි.

**3.5 පොදු තැන්පත් ගිණුම**

---------------------

එකතුව රු. මිලියන 13.7ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි  570  හා 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

----------------------------------------------------------------------------------------

විෂය අංක 12601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ පරීක්‍ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්‍ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 215,969,889 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ තුල වර්ෂ පහකට වැඩි එකතුව රු.113,308,141 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

(ආ) ඉදිරිපත් කර තිබුණු සැසඳුම් ප්‍රකාශය, දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අනුව 2017අගෝස්තු 30 දිනට එකතුව රු.777,811 ක නිරවුල් නොකරන ලද දෝෂ තිබුණි.

(ඇ) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව අමාත්‍යාංශයෙන් බැහැරට ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂය ලෙස රු.160,620,071ක් දක්වා තිබුණද, ලැබීමට ඇති ණය කාල විශ්ලේෂණය අනුව එය රු.162,084,164ක් විය. ඒ අනුව රු. 1,464,093ක වෙනසක් නිරීක්‍ෂණය විය.

(ඈ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, 2016 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ ශේෂය අතර හඳුනා නොගත් වෙනස රු. 5,301,749 ක් විය.

## 3.7 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

--------------------------------------

### 3.7.1 අභ්‍යන්තර විගණනය

---------------------

2016 වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණන සැලසුම් සකස් කර තිබුණද, ඒ අනුව විගණන කටයුතු සිදු කර නොතිබුණු අතර, සිදු කරන ලද විමර්ශන වාර්තා හෝ විමසුම්වල පිටපත් වැඩි ප්‍රමාණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3.7.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

-------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුලත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු අතර, එම වාර්තාව 2017 සැප්තැම්බර් 04 දින පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට නියමිත බව දන්වා තිබුණි. 2015 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව 2016 නොවැම්බර් 16 දින පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණි.

## 3.8 වත්කම් කළමනාකරණය

---------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

### (අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

--------------------------------------

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ පළමුවන හෝ දෙවන කාළ රාමු ප්‍රකාරව 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2017 මාර්තු 17 හෝ 2017 ජුනි 15ට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2017 අගෝස්තු 30 දක්වාත් ජාතික පාසැල් 178ක, ගුරු මධ්‍යස්ථාන**40** ක,පරිගණකමධ්‍යස්ථාන 35ක සහ ඔරුගොඩවත්ත හා පත්තල ගෙදර ගබඩාවල සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. 2015වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු ඔරුගොඩවත්ත හා පත්තල ගෙදර ගබඩාවල හැර සිදුකර තිබුණි.

### (ආ) බාහිර පාර්ශවයන් විසින් භුක්ති විඳිමින් පවතින වත්කම්

--------------------------------------------------------

අමාත්‍යාංශයේ ජාතික පාසැල්, ගුරු විද්‍යාල හා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සතුව පවතින පර්චස් 04 සිට පර්චස් 224 දක්වා පරාසයක භූමි ප්‍රමාණයන් සහිත වූ නාගරිකව පිහිටා ඇති ඉඩම් 80 ක් අනුමැතියකින් හා අවසරයකින් තොරව බාහිර පාර්ශවයන් භුක්ති විඳිමින් පැවතුණ අතර, ඉහල තක්සේරු වටිනාකම්වලින් යුක්ත ඇතැම් ඉඩම්වල විශාලත්වය හා වර්තමාන වටිනාකම්වල තොරතුරු අමාත්‍යාංශය තුල නොතිබුණි.

**(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

ආරක්ෂක සේවා විද්‍යාලයට අවශ්‍ය ගොඩනැගිලි නාගරික සංවර්ධන අධිකාරිය සතු හෙක්ටයාර් 1.9329 ක් වූ භූමියෙහි, 2008 වර්ෂයේ සිට රු.1,098,236,071 ක් වැය කරමින් ඉදිකර තිබුණු නමුත් විද්‍යාලයීය භූමියේ නෛතික අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට නොහැකි වී තිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශය විසින් 2016 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු. 85,901,912 ක් විය.

## 3.9 අනුකූල නොවීම්

**නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (i) | **ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**<br>ආයතන සංග්‍රහයේ දෙවන පරිච්ඡේදයේ 13.3 වගන්තිය | | ආයතන සංග්‍රහය අනුව වැඩ බැලීමේ නිලධාරියකු වුවද පත් කළ හැකි වන්නේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වන නමුත්, 2017අගෝස්තු30 දින වන විටත් දිවයින පුරා පිහිටි ජාතික පාසැල් 352න් පාසැල් 228ක විදුහල්පති පුරප්පාඩු සඳහා වැඩ ආවරණය කිරීම සඳහා නිලධාරීන් යොදවා තිබුණි. |

| | |
|---|---|
| II වැනි කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 1.2, 13.2 හා 17.12 වගන්ති | i. 2008 වර්ෂයේ සිට 2017 අගෝස්තු 30 දින දක්වා කාලපරිච්ඡේදය තුල අක්‍රමිකතා හා විවිධ අවිනය ක්‍රියා හේතුවෙන් පාසැල් පද්ධතිය තුල නොවිසඳී තිබුණු විනය ගැටළු ප්‍රමාණය 343 ක් විය. ඒ තුල විදුහල්පතිවරු 69කට හා ගුරු හා අනධ්‍යයන කාර්‍ය මණ්ඩල 274 කට අදාල ගැටළු විය.<br><br>ii. නියමිත කාලයක් තුලදී විනය ක්‍රියාමාර්ග නොපමාව නිම කිරීමට කටයුතු කළ යුතු වුවත්, 2016 සැප්තැම්බර් 20 දින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරියකු වෙත නිකුත් කර තිබුණු විනය නියෝගයක් 2017 මැයි 16 දින දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි.<br><br>iii. විනය පරීක්ෂණ අප්‍රමාදව නිම නොකිරීම,විශ්‍රාම යාමට නියමිත නිලධාරීන්ට විශ්‍රාම පාරිතෝෂික වැටුප් හා දීමනා,උසස්වීම් හිමිවිය යුතු නිලධාරීන්ට එම අවස්ථා,වැටුප් වර්ධක හා වෙනත් වරප්‍රසාද ලැබීමේ හිමිකම ප්‍රමාදවීමට හෝ අහිමිවීමට හේතු වී තිබුණි. සත්‍ය වශයෙන්ම වැරදි සිදුකළ නිලධාරීන්ට දිගුකලක් සියළු වරප්‍රසාද භුක්ති විඳිමින් එම කාර්යයන්වලම නියැලීමට ඇති ඉඩකඩ පැවතුණි.<br><br>iv. අධ්‍යාපනයේ ගුණාත්මක භාවය,සිසු විනය හා සදාචාරය මනා අයුරින් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවර ගැනීම අමාත්‍යාංශයේප්‍රධාන කාර්යයන්ගෙන් එකක් විය. පාසැල් තුල සිදුවන ළමා අපචාර සිද්ධීන්වලට අදාලව ඉතා කඩිනම්ව විනය පරීක්ෂණ පවත්වා දඬුවම් ලබාදිය යුතුව තිබුණු නමුත්,එසේ අප්‍රමාදව කටයුතු නොකිරීමෙන්ද,ඔවුන් වෙනත් පාසැල් වෙත මුදා හැරීමෙන්ද,එසේ විනයානුකූලව කටයුතු නොකර අදාල පාසැල් තුලම රඳවා තබාගැනීමෙන්ද පාසැල් සිසුන්ගේ අධ්‍යාපන කටයුතු,මානසික තත්ත්වයන් මෙන්ම පාසැලේ විනය පිරිහීමේ තත්ත්වයන්ද උද්ගත වී තිබුණි. |
| xii වැනි පරිච්ඡේදයේ 1.1 වගන්තිය | ආයතන සංග්‍රහය ප්‍රකාරව නිවාඩු සඳහා විධිමත් අනුමැතියක් ලබා ගත යුතු නමුත්, 2016 වර්ෂය තුළදී ජාතික පාසැල් 35 ක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 198 දෙනෙකු විසින් අනුමැතියකින් තොරව ලබා ගෙන තිබුණු මුළු නිවාඩු දින ගණන 5,072 ක් විය. |
| vii වැනි පරිච්ඡේදයේ 2 වගන්තිය | 2016 වර්ෂය තුළදී ජාතික පාසැල් 143 ක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 712 දෙනෙකු දින 15,973 ක් වැටුප් රහිත නිවාඩු ලබා ගෙන තිබුණු නමුත් වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

(iii) අධ්‍යාපනඅමාත්‍යාංශ චක්‍රලේඛ

-------------------------------------

2007 දෙසැම්බර් 13 දිනැති අංක 2007/20 දරන චක්‍රලේඛ

අදාල චක්‍රලේඛ විධිවිධාන හා අංක 10/2377/436/052 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කවර හෝ රජයේ පාසැලක වසර 08 කට වඩා වැඩි සේවා කාලයක් සේවය කර ඇති ගුරුවරුන් ස්ථාන මාරු කළයුතු වුවත්, නියැදි පරීක්ෂණවලදී ඊට අනුකූලව ස්ථානමාරු නොකළ පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

1. ජාතික පාසැල්193 ක ගුරුභවතුන් 5,905 දෙනෙකු වර්ෂ 08 ත් 27 ත් අතර කාලයක් ස්ථාන මාරුවීම් නොලබා එකම පාසැලක සේවයේ යෙදී තිබුණි.
2. ජාතික පාසැල් 152 ක ගුරුභවතුන් 873 දෙනෙකු ඔවුන් පත්වීම් ලද විෂයයට පරිභාහිර විෂයයන් ඉගැන්වීම සඳහා අනුයුක්ත කර තිබුණි. විශේෂයෙන් ජාතික පාසැල් 36ක ප්‍රාථමික ගුරු පුහුණුව නොලද ගුරුභවතුන් 137 දෙනෙකු ප්‍රාථමික ශ්‍රේණිවලට අනුයුක්ත කර තිබුණි.

2016 ජනවාරි 01 දිනැති අංක 01/2016 දරන චක්‍රලේඛය

i. චක්‍රලේඛයේ දැක්වෙනවිධිවිධාන ප්‍රකාරවහඳුනාගෙන තිබුණු, 2016 දෙසැම්බර් 31දිනට ජාතික පාසැල්183 ක පවතින ගුරු ඌනතා2,361ක් හා ජාතික පාසැල් 163 කපවතින ගුරු අතිරික්තතා 1,527 ක් අවම කර ගැනීමට කටයුතුකර නොතිබුණි.

ii. චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, ජාතික පාසැලක නියෝජ්‍ය විදුහල්පතිවරුන් වෙත සතියකට කාල පරිච්ඡේද10 ක්වත් ඉගැන්වීම් කටයුතු පැවරිය යුතු නමුත් ජාතික පාසැල් 101 ක නියෝජ්‍ය විදුහල්පතිවරුන් 225 දෙනෙකු වෙත එකම කාල පරිච්ඡේදයක් හෝ ඉගැන්වීම් කටයුතු පවරානොතිබුණු අතර ජාතික පාසැල් 5 ක නියෝජ්‍ය විදුහල්පතිවරුන් 6 දෙනෙකු වෙත ලබාදී තිබුණු කාලපරිච්ඡේද සංඛ්‍යාව 02 ත් 06 ත් අතර පරාසයකින් යුක්ත විය.

iii. චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, සහකාර විදුහල්පතිවරුන් වෙත සතියකට කාල පරිච්ඡේද 12 ක්වත් ඉගැන්වීම් කටයුතු පැවරිය යුතු නමුත් ජාතික පාසැල් 33 ක සහකාර විදුහල්පතිවරුන් 69 දෙනෙකු වෙත එකම කාල පරිච්ඡේදයක් හෝ ඉගැන්වීම් කටයුතු පවරා නොතිබුණු අතර ජාතික පාසැල් 6 ක සහකාර විදුහල්පතිවරුන් 6 දෙනෙකු වෙත ලබාදී තිබුණු කාලපරිච්ඡේද සංඛ්‍යාව 02 ත් 06 ත් අතර පරාසයකින් යුක්ත විය.

iv. චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, විෂයය ඉගැන්වීමේ නියුතු ගුරුභවතුන් පිළිවෙලින් සතියකට අවම වශයෙන් විනාඩි 40 කාලපරිච්ඡේද 35 ක් ඉගැන්වීමේ

කාර්යයෙහි නියුක්ත කර විය යුතු වුවද, ජාතික පාසැල් 136 ක ගුරුභවතුන් 769 දෙනෙකු වෙත එකම ඉගැන්වීම් කාලපරිච්ඡේදයක් හෝ ලබාදී නොතිබුණු අතර ජාතික පාසැල් 144 ක ගුරුභවතුන් 1,075 දෙනෙකු වෙත ඉගැන්වීම් කාලපරිච්ඡේද16 කට වඩා අඩු සංඛ්‍යාවක් ලබාදී තිබුණි.

| | |
|---|---|
| 2016 ජනවාරි 07 දිනැති අංක 01/2016 දරන චක්‍රලේඛය | i. ජාතික පාසැලක් සඳහා නියමිත නියෝජ්‍ය විදුහල්පතිවරුන් සංඛ්‍යාව ඉක්මවා ජාතික පාසැල් 55 ක නියෝජ්‍ය විදුහල්පතිවරුන් 99 දෙනෙකු පත්කර තිබුණි.<br>ii. ජාතික පාසැලක් සඳහා නියමිත සහකාර විදුහල්පතිවරුන්සංඛ්‍යාව ඉක්මවා ජාතික පාසැල් 28 ක සහකාර විදුහල්පතිවරුන් 61 දෙනෙකු පත්කර තිබුණි.<br>iii. ජාතික පාසැලක අධීක්ෂණ කාර්යයේ නියුතු ගුරුභවතුන් වෙත සතියකට අවම වශයෙන් විනාඩි 40 ක ඉගැන්වීම් කාල පරිච්ඡේද 16 ක් පැවරිය යුතු වුවත්, ජාතික පාසැල් 14 ක ගුරුභවතුන් 59 දෙනෙකු වෙත එකදු කාල පරිච්ඡේදයක් හෝ ලබාදී නොතිබුණු අතර, ජාතික පාසැල් 12 ක ගුරු භවතුන් 66 දෙනෙකු වෙත ඉගැන්වීම් කාල පරිච්ඡේද 16 කට වඩා අඩු සංඛ්‍යාවක් ලබාදී තිබුණි. |
| 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 37/2008 හා 2016 මැයි 16 දිනැති අංක 17/2016 දරන චක්‍රලේඛයෙහි 3.1 ඡේදය | ජාතික පාසැලක ප්‍රාථමික ශ්‍රේණිවල සමාන්තර පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 40 ක් හා ද්විතියික ශ්‍රේණිවල සමාන්තර පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 45 ක්ද, පලමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීමේදී පන්තියක් සඳහා තෝරාගත යුතු මුළු ළමුන් සංඛ්‍යාව 40 ක්ද, වශයෙන් දක්වා තිබුණු නමුත්, මෙම සීමාවන් ඉක්මවා ජාතික පාසැල් 116 ක් විසින් ඇතුලත් කරගෙන තිබුණු මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 9,639 ක් විය. ඒ අතර, ජනප්‍රිය පාසැල් ලෙස සැලකෙන ජාතික පාසැල් 32 ක් විසින් අදාල සීමාව ඉක්මවා ඇතුලත් කර තිබුණු මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 5,373 ක්ද විය. |
| 2012 නොවැම්බර් 23 දිනැති අංක 42/2012 දරන චක්‍රලේඛය | දිවයිනේ පළාත් 9 හි විශේෂ අධ්‍යයන ගුරු පුරප්පාඩු සංඛ්‍යාව 411 ක් වූ අතර, විශේෂ අධ්‍යයන ගුරු පුහුණුව ලැබූ ගුරුවරුන් 355 ක් වෙනත් පාසැල් හෝ පන්ති කාමරවල සේවයේ යෙදී තිබුණි. |

## 3.10 විදේශාධාර ව්‍යාපෘති හා වැඩසටහන්

------------------------------------------------

(අ) දැනුම කේන්ද්‍රිය පදනම ලෙස පාසැල් අධ්‍යාපනය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය

------------------------------------------------------------------------------------------

2012 මැයි 18 දිනැති ගිවිසුම ප්‍රකාරව 2012 ඔක්තෝබර් 01 දිනෙන් ආරම්භ කරන ලද ව්‍යාපෘතිය 2017 ජුනි 30 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. පළාත් හා කලාප සම්බන්ධීකරණ හා කලාප සම්පත්දායකයින් දැනුවත් කිරීම සඳහා රු. මිලියන 1.786 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, එම වැඩ සටහන් පැවැත්වීමට අපොහොසත්ව තිබුණි.

ii. විශේෂ අවශ්‍යතා සහිත සිසුන් වෙනුවෙන් පහසුකම් සැලසීම වෙනුවෙන් රු.මිලියන 0.5 ක ප්‍රතිපාදන සලසා තිබුණු නමුත්, එම වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

iii. වාර්ෂික සැලසුම් අනුව පොත් 40,000 ක් මුද්‍රණය කිරීමට සැලසුම් කර තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

iv. ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු. මිලියන 356.58 ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විට සම්පූර්ණ කළයුතුව තිබුණු ඌව පළාතේ ගුරුතලාව මධ්‍ය විද්‍යාලය, ආඳා උල්පත මධ්‍ය විද්‍යාලය, මහියංගණය මධ්‍ය විද්‍යාලය හා විශාඛා විද්‍යාලයට අදාල ගොඩනැගිලි ඉදිකිරීම් ඒ අනුව අවසන් කර නොතිබුණි.

v. ව්‍යාපෘති වැඩ සැලසුම් අනුව ජාතික හා පළාත් පාසැල්තුල මහින්දෝදය තාක්‍ෂණික විද්‍යාගාර 1,005 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එයින් 996 ක ඉදිකිරීම් අවසන් කර තිබුණු අතර, 15ක් සඳහා විදුලිය පහසුකම් සපයාගෙන නොතිබුණු බැවින්, සිසු පරිහරණය සඳහා යොදා ගැනීමට නොහැකිවී තිබුණි. නුවර දිස්ත්‍රික්කයේ විග්නේශ්වරන් දෙමළ විද්‍යාලයේ විද්‍යාගාරයක් ඉදිකර විදුලිය ලබා දී තිබුණද, පරිගණක, ජාල පද්ධතිය, සහ අනෙකුත් උපකරණ සපයා නොතිබීම හේතුවෙන් සිසු පරිහරණය සඳහා යොදා ගැනීමට නොහැකි වී තිබුණි.

vi. තංගල්ල බාලිකා මහා විද්‍යාලයේ මහින්දෝදය තාක්‍ෂණික විද්‍යාගාරයේ ඉදිකිරීම් අවසන් කර නොතිබුණ අතර, එම විද්‍යාගාර වෙත පරිගණක 66 හැර අනෙකුත් සියළුම භාණ්ඩ සපයා තිබුණි. ඉඩ පහසුකම් නොමැතිවීම හේතුවෙන් පරිගණක පුටු හා මේස අවිධිමත්ව ගබඩා කර තැබීම නිසා, ඒවා භාවිතයට නොගෙනම භාවිතයට නුසුදුසු මට්ටමට පත්වෙමින් තිබුණි.

vii. රණබිම ජාතික විදුහලේ විද්‍යාගාරයට ලබාදී තිබුණු පරිගණක පුටු හා නැණස අංශයට ලබාදී තිබුණු පුටු ගුණාත්මක බවින් හා ප්‍රමිතියෙන් අවම මට්ටමක පැවතුණි. නැණස අංශයේ පුටු 30 ක පමණ අත් ඇදී කැඩී තිබුණි. ගණිතාගාරයේ හා විද්‍යාගාරයේ උපකරණ මාරුකර සවිකර තිබීම හේතුවෙන් අවශ්‍යතාවයන් සඳහා නිසි පරිදි උපයෝජනය කිරීමට නොහැකිවී තිබුණි.

viii. කිරිබත්කුඹුර ස්වර්ණජෝති ජාතික පාසැලේ ගණිතාගාරය සඳහා අවශ්‍ය ප්‍රමාණයට වැඩියෙන් ගණිත උපකරණ ලැබී තිබුණු අතර, එහි උසස් පෙළ භෞතික විද්‍යාව හදාරන සිසුන් 08 දෙනෙකු පමණක් විය. අතිරික්ත උපකරණ වෙනත් පාසැලක දරුවන් වෙත ලබාදීමට හැකිව තිබුණු මෙම උපකරණ අවශ්‍ය ප්‍රමාණය නිසි අයුරු හඳුනා ගැනීමකින් තොරව බෙදා හැරීම හේතුවෙන් අපරිස්සම්කාරී ලෙස ස්ථාන කිහිපයක ගොඩ ගසා තිබුණි. ලබාදී ඇති උපකරණවලින් බොහොමයක් ගුණත්වයෙන් අඩු මට්ටමක පැවතුණි.

(ආ) අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන

---------------------------------------------

2013 අගෝස්තු 19 දිනැති ගිවිසුම අනුව මෙම වැඩසටහන 2013 අගෝස්තු 23 දින ආරම්භ කර 2018 අගෝස්තු 31 දින අවසාන කිරීමට නියමිතව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට එහි කාර්යසාධනය පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. වැඩසටහන සඳහා වෙන්ව තිබූ මුළු මුදල එ.ජ. ඩොලර් මිලියන 200 ක් (රු. මිලියන 26,000) වූ අතර, වර්ෂ 03 ක කාලයක් තුල උපයෝජනය කල මුළු මුදල එ.ජ. ඩොලර් මිලියන 141 (රු. මිලියන 18,330ක් පමණ) ක් විය. ප්‍රතිශතයක් ලෙස එය සියයට 70.5 ක ප්‍රමාණයක් විය.

ii. 2016 වර්ෂයේදී ගොඩනැගිලි නඩත්තු හා අළුත්වැඩියා සඳහා රු. මිලියන 700 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණි. රු.මිලියන 687.4 ක බැඳීම් ඇති කරගෙන තිබුණද, අක් මුදල් සීමා වීම මත මෙම වැඩ සටහනද ඇතුළුව බිලියන 5 ක වටිනාකමින් යුත් බිල් ගෙවීමට නොහැකිවී තිබුණි.

iii. වැඩසටහන මගින් පාසැල් විදුහල්පතිවරු 692 ක් සහ නියෝජ්‍ය විදුහල්පතිවරු 780 දෙනෙකු පුහුණු කර තිබුණු අතර, ජාතික පාසැල් 228 කම විදුහල්පති පුරප්පාඩු පැවතීම හේතුවෙන් විදුහල්පති පුරප්පාඩු පිරවීමේදී එය සාර්ථක ප්‍රතිකර්මයක් ලෙස භාවිතා කිරීමට අපොහොසත් වී තිබුණි.

iv. වැඩසටහනේ ක්‍රියාකාරී සැලසුම් අනුව මහින්දෝදය විද්‍යාපීඨ 250 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඉන් 238 ක ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණු අතර, 227 ක් සිසු පරිහරණය සඳහා යොදාගෙන තිබුණි. 2017 අගෝස්තු අවසාන වන විටද විද්‍යාපීඨ 45 ක් සඳහා තෙකලා විදුලි පහසුකම් සපයාදීමට නොහැකිවී තිබුණි.

v. මාතර දිස්ත්‍රික්කයේ මහානාග මහා විද්‍යාලය සඳහා තාක්ෂණික විද්‍යාපීඨ ඉදිකර තිබුණද, ජෛව පද්ධති තාක්ෂණ විෂය ධාරාව සඳහා වන පන්ති ආරම්භ කර නොතිබුණි.

vi. දිවයින පුරා තාක්ෂණික විෂය ධාරාව සඳහා විශාල වශයෙන් ගුරු පුරප්පාඩු පැවතුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විට එය 327 ක් වූ බැවින්, වැඩසටහනෙන් අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීම අපහසු වී තිබුණි.

vii. තාක්ෂණික විෂය ධාරාව සඳහා සිසුන් 47,473 ක් සහ විද්‍යාව හා ගණිත විෂය ධාරාව සඳහා සිසුන් 117,382 ක් සමාලෝචිත වර්ෂයේ අ.පො.ස. උසස් පෙළ සඳහා පෙනී සිට තිබුණු අතර, එය ඉකුත් වර්ෂයේදී පිළිවෙලින් 42,514 ක් හා 118,901 ක් වී තිබුණි. වාණිජ විෂය ධාරාව සඳහා සමාලෝචිත වර්ෂයේ සිසුන් 111,883 ක් පෙනී සිට තිබුණ අතර, ඉකුත් වර්ෂයේදී 117,238 ක් පෙනී සිට තිබුණි.

viii. 2016 වර්ෂයේදී අ.පො.ස (උසස් පෙළ) සඳහා පෙනී සිටි පාසැල් අයදුම්කරුවන් 211,865 න් 17,702 ක් හෙවත් සියයට 8.36 ක් සියළුම විෂයයන් අසමත්ව තිබුණි. සියළුම විෂයයන් සඳහා A සමාර්ථ ලද සංඛ්‍යාව 6,468 ක් හෙවත් සියයට 3.05 ක් විය. වාණිජ විෂය ධාරාවෙන් සියයට 69.64 ක් භෞතික විෂය ධාරාවෙන් සියයට 53.26 ක් හා ජීව විද්‍යා විෂය ධාරාවෙන් සියයට 53.35 ක් විශ්ව විද්‍යාල සඳහා සුදුසුකම් ලබා තිබුණි. තාක්ෂණික විෂය ධාරාවෙන් උසස් පෙළ සඳහා පෙනී සිටි දෙවන වසර වන සමාලෝචිත වර්ෂයේදී ජෛව පද්ධති තාක්ෂණ විෂය ධාරවෙන් සියයට 60.16 ක් හා ඉංජිනේරු තාක්ෂණ විෂය ධාරාවෙන් සියයට 55.58 ක් විශ්ව විද්‍යාල සඳහා සුදුසුකම් ලබා තිබුණි.

ix. වැඩ සටහනේ ඉලක්ක අනුව සමාලෝචිත වර්ෂයේ උසස් පෙළ ප්‍රතිඵල සියයට 64 දක්වා නැංවීම අරමුණු වී තිබුණද, එය සියයට 62.17 ක් පමණක් වූ බැවින් ඒ වෙනුවෙන් සලසා තිබුණු එක්සත් ජනපද ඩොලර් මිලියන 2.5 ක් හා විශේෂ ගැණුම් හිමිකම් මිලියන 1.66 ක් ලබාගැනීමට නොහැකි වී තිබුණි.

x. විද්‍යා හා වාණිජ විෂය ධාරාව සඳහා සිසු සහභාගීත්වය වැඩි කිරීම වැඩ සටහනෙන් අපේක්ෂිත ඉලක්කයක් වූවද, එය ඉටුවී නොතිබුණු බැවින් ඒ සඳහා සලසා තිබුණු එක්සත් ජනපද ඩොලර් මිලියන 5 ක් හා විශේෂ ගැණුම් හිමිකම් මිලියන 3.33 ක් ලබාගැනීමට නොහැකිවී තිබුණි.

xi. වැඩසටහනෙන් කාර්ය මණ්ඩල පුහුණුවීම් සඳහා රු. මිලියන 800 ක් වෙන්කර තිබුණි. එයින් කෙටිකාලීන විදේශ ශිෂ්‍යත්ව වැඩ සටහන් සඳහා වෙන්කර තිබුණු රු. මිලියන 10 ක මුදලද, නව විෂයක් වශයෙන් හඳුන්වා දී තිබුණු ජෛව පද්ධති තාක්‍ෂණ විෂය පිළිබඳව අනෙකුත් රටවල් කටයුතු කරන ආකාරය පිළිබඳ පුහුණුවීම් වෙනුවෙන් වෙන්කර තිබුණු රු. මිලියන 10 ක මුදලද එම කාර්යයන් සඳහා යොදාගෙන නොතිබුණි.

xii. තාක්ෂණික විද්‍යාපීඨ උපකරණ මිලදී ගැනීම සඳහා වෙන්කර තිබුණු රු. මිලියන 1.320 න් රු. මිලියන 685.66 ක් හෙවත් සියයට 52 ක් පමණක් වර්ෂය තුල උපයෝජනය කර තිබුණි.

xiii. සමාලෝචිත වර්ෂය සඳහා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා වෙන්කර තිබුණු රු. මිලියන 80 ක මුදල ඒ සඳහා උපයෝජනය කර නොතිබුණි.

xiv. සිවිල් ඉංජිනේරු උපකරණ, විදුලි ඉංජිනේරු උපකරණ හා තාක්ෂණික ඉංජිනේරු උපකරණ මිලදී ගැනීම සඳහාරු. මිලියන 70 ක් 30 ක් සහ 125 ක් පිළිවෙලින් වෙන්කර තිබුණු නමුත්, එම උපකරණ තුන් වර්ගයම මිලදී ගැනීම වෙනුවෙන් වැයකර තිබුනේ රු.මිලියන 39.3 ක් පමණක් වූ බැවින්, රු.මිලියන 82.6 ක් උපයෝජනය නොකර ඉතිරිව තිබුණි. කෙසේවුවද උපකරණ නොමැතිවීම හේතුවෙන් ඇතැම් විද්‍යාපීඨ ඵලදායී ලෙස භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි.

xv. තංගල්ල බාලිකා මහා විද්‍යාලයට තාක්ෂණික විද්‍යාපීඨයක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර ප්‍රතිපාදන වෙන්කර තිබුණු නමුත්, 2016 ජුලි අවසන් වනතුරුත් ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. එසේ වුවද විද්‍යාපීඨයට අවශ්‍ය උපකරණ පාසැල වෙත සපයා තිබුණු අතර, ඒවා නිසි පරිදි රඳවා තබාගැනීමට හා අවශ්‍යතාවය අනුව ප්‍රයෝජනයට ගැනීමට අවකාශ සැලසී නොතිබුණි.

xvi. සමාලෝචිත වර්ෂය අවසාන වන වි ටපාසැල් 353 ක උසස්පෙළ තාක්ෂණික විෂය ධාරාව ආරම්භකර තිබුණු අතර, සිසුන් 48,426 ක් එම විෂය ධාරා තෝරාගෙන තිබුණි.

xvii. සිංහලමාධ්‍යය සිසුන් 4 සිට 19 දක්වා සිටින පාසැල් 17 කට හා සිසුන් 26 ක් බැගින් සිටින පාසැල් 03 කට ගුරුභවතුන් දෙදෙනෙකු බැගින්ද දෙමළ මාධ්‍ය සිසුන් 36 දෙනෙකු සිටින පාසැලකට ගුරුභවතුන් තිදෙනෙකුද අනුයුක්ත කර තිබුණි. ඒ අනුව ජෛව පද්ධති තාක්‍ෂණවේදය විෂය ඉගැන්වීම සඳහා විධිමත් පරිදි ගුරුභවතුන් අනුයුක්ත කර නොතිබුණි.

(ඈ) යුනෙස්කෝ 2014 – 2015 ද්වි වාර්ෂික ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම
-------------------------------------------------------------------------------------

යුනෙස්කෝ මූලස්ථානය විසින් 2014 – 2015 කාලය සඳහා ක්‍රියාත්මක කිරීමට අනුමත කරන ලද ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2015 ජුලි 20 දින ප්‍රදානයක් ලෙස ඇමරිකන් ඩොලර් 61,945 ක් (රු. 8,269,557) බොරුල්ලේ ලංකා බැංකු අධි ශ්‍රේණි බැංකු ගිණුමට බැරකර තිබුණි

i. ශ්‍රී ලංකාවේ විදුහල්පති භූමිකාව පිළිබඳ අධ්‍යයන කර අත්පොතක් සම්පාදනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2016 ජුනි 14 දින රු. 3,468,463 කප්‍රතිපාදන සලසා තිබුණ අතර, 2016 ජුලි 31 දිනට පෙර අදාල ව්‍යාපෘති කටයුතු අවසන් කර යුනෙස්කෝ මූලස්ථානය වෙත වියදම් වාර්තා හා ඉතිරි මුදල් ආපසු යැවිය යුතුව තිබුණි. 2016 ජුලි 31 දිනට පසුව නැවත කාලය දිගු කිරීමට යුනෙස්කෝ ආයතනය එකඟ වී නොතිබුණු බැවින් අදාල ව්‍යාපෘතිය අත් හැර තිබුණි.

ii. මධ්‍යම පරිසර අධිකාරිය මගින් ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණු කාබන් අපද්‍රව්‍ය (කාබන්ඩයොක්සයිඩ් හා හරිතාගාර වායු) පරිසරයට මුදාහැරීමෙන් සිදුවන හානිය අවම කිරීම සඳහා වන ව්‍යාපෘතිය සඳහා රු. 3,468,463 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් සියයට 40 ක් වන රු. 1,387,385 ක් 2016 ජනවාරි 08 දින මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලබාදී තිබුණි. 2016 ජුලි 31 දිනට මෙම ව්‍යාපෘතිය අවසන් කළ යුතුව තිබුණු අතර, එදිනට රු. 531,688 ක් වියදම් දරා තිබුණු නමුත්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

iii. 2014 – 2015 ද්වි වාර්ෂික යෝජනා ක්‍රමය යටතේ 2016 ජුලි 31 දිනට අවසන් නොකළ මෙම ව්‍යාපෘතිවලට අදාල මුදල් බැංකු ගාස්තුද සමඟ යුනෙස්කෝ මූලස්ථානය වෙත යැවීම සඳහා 2016 දෙසැම්බර් 20 දින අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව රු. 8,269,557 ක් වූ මුළු මුදලින් සියයට 87.45 ක් ආපසු හරවා යවා තිබුණි. ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කරගැනීමට අපොහොසත් වීම හේතුවෙන් කාලීන හා වැදගත් මාතෘකාවන් දෙකක් ඔස්සේ ක්‍රියාත්මක කල යුතුව තිබුණු ව්‍යාපෘති දෙකක් ඉටු කිරීමට නොහැකි වී තිබුණු අතර, ඉන් අත් කර ගත හැකිව තිබුණු ඵල ලබා ගැනීමට නොහැකිවී තිබුණි.

**3.11 කාර්යසාධනය**

---------------

වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා ක්‍රියාකාරී සැලසුම් අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) පෞද්ගලික පාසල්

-------------------

1961 අංක 08 දරන උපකෘත පාඨශාලා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වන වගන්තිය අනුව අවුරුදු 05 – 14 වයස් සීමාවල පසුවන ළමුන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා කිසිදු පුද්ගලයෙකු විසින් පෞද්ගලික පාසල් ආරම්භ කළ නොහැකි වුවද, ඊට අනුකූල නොවන අයුරින් ජාත්‍යන්තර හා පෞද්ගලික පාසැල් 214 ක් පමණ ආරම්භ කර තිබුණි. එම පාසැල්වල මානව හා භෞතික සම්පත්වල ගුණාත්මකභාවය තක්සේරු කිරීම හා විෂයමාලා ක්‍රියාත්මක කිරීමේදී ජාතික අධ්‍යාපනප්‍රතිපත්තිය තුල ඒවා ක්‍රියාත්මක වන්නේද යන්න අධීක්ෂණය හා නියාමනය කිරීම සඳහා විධිමත් ප්‍රතිපත්තියක් හා ප්‍රමිතියක් පවතින බව නිරීක්ෂණය නොවීය. විස්තර පහත දැක්වේ.

i. ඉහත සඳහන් පාසැල්වලට අමතරව අරඹා තිබුණු ජාත්‍යන්තර හා පුද්ගලික පාසැල්වල විස්තර අමාත්‍යාංශය සතුව නොතිබුණු අතර, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ජාත්‍යන්තර පාසැල් අධීක්ෂණය කිරීම අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණු අතරින් එකක් විය.

ii. පනතේ විධිවිධාන නොසලකා හැර කටයුතු කරමින් එලෙස පාසැල් ඇති කිරීමට අවස්ථාව නොතිබියදී පාසැල් ඇති කිරීම පිළිබඳවද, පාසැල් ඇති කිරීමේ අවශ්‍යතාවයන් මත විධිවිධාන සංශෝධනය නොකිරීම පිළිබඳවද විගණනයේදී ප්‍රශ්නගත විය.

iii. රජයේ ප්‍රතිපත්තිවලට එකඟව පවත්වාගෙන යනු ලබන පෞද්ගලික පාසැල් 80 ක් අමාත්‍යාංශයේ ලියාපදිංචි පාසැල් ලෙස සඳහන්ව තිබුණි. ඉන් 36 ක් ආධාර ලබන පාසැල්ද 44 ක් ආධාර නොලබන පාසැල්ද වූ අතර, එම පාසැල්වල සිසුන් 114,070 ක් හාගුරුභවතුන් 4,713 ක් විය.

iv. සියළුම පාසැල් ළමුන්ට තම මව් රටේ ඉතිහාසය, සංස්කෘතිය, භාෂාව හා සාරධර්ම පිළිබඳ ගුණාත්මක අධ්‍යාපනයක් ලැබීමේ හිමිකම ආරක්ෂා වෙනවාද යන්න පිළිබඳව හා භෞතික හා මානව සම්පත්වල ප්‍රමිතිය හා ප්‍රමාණය පොදු ප්‍රතිපත්තිය තුල තීරණය කර ක්‍රියාත්මක වනවාද යන්න පිළිබඳව විගණනයේදී ප්‍රශ්නගත විය.

(ආ) සිසු අරුණ අධ්‍යාපනික අරමුදල
-----------------------------------

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2001 සිට 2014 දක්වාකාලයතුලපාසැල්වල ඉගෙනීමෙහි දක්ෂ එහෙත් ආර්ථිකමය වශයෙන් දුෂ්කරතා ඇති අඩු ආදායම් ලාභී හා 5 වන ශ්‍රේණි ශිෂ්‍යාධාර නොලැබෙන ළමුන් වෙත ආර්ථිකමය වශයෙන් මාසිකව සහනදායී මුදලක් ලබාදීම අරමුණු කරගෙන 2001 වසරේදී සිසු අරුණ අධ්‍යාපනික අරමුදල පිහිටුවාගෙන තිබුණි. අරමුදල පිහිටුවා වසර 5 ක් ඉක්ම ගොස් 2016 වර්ෂය අවසාන වන විට අරමුදලේ රු.3,584,479 ක ශේෂයක් පැවතුණ නමුත්, අරමුණු ගත පරිදි ශිෂ්‍යත්ව ලබාදීම 2017 අගෝස්තු 30 දක්වාත් සිදුකර නොතිබුණි.

3.12 ජාතික පාසැල්වල කාර්යසාධනය
-------------------------------------

සමාලෝචිත වර්ෂය තුල සිදුකල සෝදිසි විගණන පරීක්ෂණවලදී, ජාතික පාසැල්වල කාර්යසාධනය සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

01. කොලඹ නාලන්දා විද්‍යාලය
--------------------------------

(අ) 2016 වර්ෂය වෙනුවෙන් සමාන්තර පන්තියකට 40 බැගින් පළමු වසරේ පන්ති 05 සඳහා සිසුන් 183 දෙනෙකු පමණක් බඳවාගෙන තිබීම හේතුවෙන් සිසුන් 17 දෙනෙකුට නියමිත ක්‍රමය තුල පාසැලට අතුල්වීමට අවස්ථාව ඇහිරී තිබුණු අතර, අවිධිමත් මාර්ගවලින් පාසැලට ඇතුලත් වීමට අවස්ථා 17 ක් නිර්මාණය වී තිබුණි.

(ආ) 2013 වර්ෂයේ රංගීරාව ප්‍රසංගය වෙනුවෙන් එළි දක්වා තිබුණු සමරු කලාපයේ පළකිරීම සඳහා ලබාදෙන ලද දැන්වීම් 138 කට අදාලව රු. 869,000 ක මුදලක්, අදාල ප්‍රසංගය පවත්වා වසර 4 ක් ඉක්ම ගොස් තිබුණද, අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) විද්‍යාලයීය ක්‍රිකට් ඇකඩමිය සඳහා 2014 හා 2015 වර්ෂවල හිඟ හිටිව තිබුණු මුදල රු. 997,500 ක් වූ අතර, බැඩ්මින්ටන් සඳහා රු. 345,000 ක් විය.

(ඈ) පිහිණුම් තටාකයෙන් ලද ආදායම ලෙස 2014 මූල්‍ය ප්‍රකාශනවල පෙන්වන ලද ශේෂය හා තටාකයේ පොත්වල පෙන්වන ශේෂය අතර, රු.719,900 ක නොසැසඳුනු වෙනසක් විය. පුහුණුකරුවන් 9 දෙනෙකු බාහිර පාර්ශවයන් පුහුණු කිරීම සඳහා මෙම පිහිණුම් තටාකය භාවිතා කරන අතර, නිවැරදි ආදායම ගිණුම් ගත වෙනවාද යන සාධාරණ සැකයෙන් බැහැරවීමට විගණනයේදී නොහැකි විය.

(ඉ) 2013 නොවැම්බර් 28 දිනැති අංක 07/2013 චක්‍රලේඛයේ 4.2.5.1 (ඈ) අනුව පාසැල් සංවර්ධන සැලැස්ම පදනම්ව පාසැලේ සමස්ථ වැඩ සටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය ශිෂ්‍ය කාර්ය ප්‍රගතිය හා පාසැල ලබාගත් ජයග්‍රහණ ඇතුලත් කාර්යසාධන වාර්තාවක් මාර්තු 31 දිනට පෙර පිළියෙල කර ජාතික පාසැල් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළයුතු වුවද, 2016 වර්ෂය වෙනුවෙන් ඒ අනුව කටයුතු කර

නොතිබුණි. මීට අමතරව 4.1.2.6 අනුව හා 4.2.5.1 (iii) අනුවද, 2014, 2015 හා 2016 වර්ෂවල කටයුතු කර නොතිබුණි.

(ඊ) වර්ෂ 08 ක සේවා කාලයක් ඉක්මවූ ගුරු මාරු නොලද ගුරුභවතුන් සංඛ්‍යාව 95 ක් වූ අතර, එය සමස්ථ ගුරු මණ්ඩලයෙන් සියයට 51 ක් විය. ඊට අමතරව ගුරුභවතුන් 12 ක ඌනතාවයක් හා 26 ක අතිරික්තයක් විය. මීට අමතරව ගුරුභවතුන් 29 ක් වැනි ප්‍රමාණයක් දිනපතා නිවාඩු ලබාගෙන තිබුණි.

(උ) ඇතැම් ගුරුභවතුන් වෙත කාල සටහන් ලබාදී නොතිබුණු අතර, ඇතැම් අවස්ථාවල අඩු කාලච්ඡේද සංඛ්‍යාවක් ලබාදී තිබුණි. විනාඩි 40 කාලච්ඡේද 12 ක් සතිපතාම ඉගැන්වීම් කාර්යයේ යෙදිය යුතු සහකාර විදුහල්පතිවරුන් වෙත එක කාලච්ඡේදයක්වත් ලබාදී නොතිබුණි.

02. වෙන්නප්පුව ජෝශප් වාස් විදුහල

-----------------------------------------

(අ) පාසැලේ විදුහල්පති තනතුරේ 2010 ඔක්තෝබර් 19 දින සිට 2016 වර්ෂය අවසානය දක්වාද වැඩ බලන විදුහල්පතිවරයෙකු වැඩ ආවරණය කරමින් පැවතුණ අතර, වැඩ බලන විදුහල්පති වෙත 2012 අගෝස්තු 08 සිට බලපැවැත්වෙන පරිදි විදුහල්පති සේවයේ 2.II අධි ශ්‍රේණියේ පත්වීමක් ලබා දී ඇති බව දන්වා එවා තිබුණි.

(ආ) 2016 වර්ෂය සඳහා පළමු ශ්‍රේණියේ පන්ති පහ තුල සිසුන් 200 ක් සිටිය යුතු වුවත්, සිසුන් 188 ක් බඳවාගෙන තිබුණු අතර, පොරොත්තු ලේඛනයේද 149 ක් සිටියදී ඉතිරි පුරප්පාඩු 12 ක් සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විද්‍යාලයේ ගුරුභවතුන් 63 දෙනෙකු වර්ෂ 8 ත් වර්ෂ 34 ත් අතර කාලයක් ස්ථාන මාරුවීම් නොලබා තිබුණු අතර, ගුරු ඌණතා 35 ක් හා ගුරු අතිරික්තතා 30 ක් විය.

(ඈ) 2014 වර්ෂයේ සිට රු. 2,248,897 ක පහසුකම් හා සේවා ගාස්තු හිඟ හිටව තිබුණි.

(ඉ) පාසැලට පළමු ශ්‍රේණිය සඳහා ළමුන් ඇතුලත් කිරීමේදී රෝමානු කතෝලික ළමුන්ට ප්‍රමුඛස්ථානයක් හිමිව තිබුණි.ලැබී තිබුණු අයදුම්පත්වලින් සියයට 20 ක් පමණ බෞද්ධ හා වෙනත් ආගම්වල දරුවන්ගෙන් වන නමුත් සියයට 5 ක පමණ

ප්‍රමාණයක් පමණක් බඳවාගෙන තිබුණි. එසේ වුවද, 2 සිට 11 දක්වා ශ්‍රේණිවල බෞද්ධ සිසුන්ගේ ප්‍රමාණය ක්‍රමයෙන් වැඩිවෙමින් පැවතුණු අතර, එය සියයට 6 සිට 30 දක්වා ප්‍රමාණයක් විය. ඒ අනුව අතරමැදි ශ්‍රේණි සඳහා දරුවන් බඳවාගැනීමේ ප්‍රවණතාවයක් පවතින බවත් එසේ සිදුකිරීම පළමු වසර සඳහා ඉල්ලුම් කල දරුවන්ට සිදුකරන අසාධාරණයක් වන බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

03. හොරණ ශ්‍රීපාලි විද්‍යාලය

----------------------------

(අ) වසර 8 කට වැඩි සේවා කාලයක් සහිත ගුරුවරුන් 54 ක් ස්ථාන මාරුවීම් ලබා නොතිබුණු අතර, එය සමස්ථ ගුරු මණ්ඩලයෙන් සියයට 31 ක් විය. ඊට අමතරව ගුරුභවතුන් 20 දෙනෙකුගේ ඌණතාවයක් හා එක් ගුරුභවතෙකුගේ අතිරික්තයක් විය.

(ආ) පාසැල් සංවර්ධන අරමුදලේ වන රු. මිලියන 5.3 කට ආසන්න මුදලක් බැංකු ජංගම ගිණුමක රඳවා තිබුණු අතර, 07/2013 චක්‍රලේඛයේ 10.2 වගන්තිය අනුව කෙටිකාලීන අයෝජනයක යෙදවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2006 ජුනි 20 දිනැති අංක 2006/27 දරන චක්‍රලේඛයේ 8.2 ඡේදය ප්‍රකාරව ශිෂ්‍යත්වධාරීන්ගේ ශිෂ්‍යාධාර වවුචර්පත්වල කටයුතු සිදුකර නොතිබුණි.

04. හාලි ඇල මහා විද්‍යාලය

----------------------------

(අ) පාසැලේශිෂ්‍යයන්ගේ අධ්‍යාපන කාර්යසාධනය විභාග ප්‍රතිඵල මගින් තහවුරු කර ගත යුතු වන නමුත්, රජයේ සියළුම විභාගවල ප්‍රතිඵල ක්‍රමයෙන් පහත බැස තිබුණි. මේ අනුව පාසැලේ ප්‍රධානම අරමුණ වන ශිෂ්‍යයන් අධ්‍යාපනයෙන් පරිපූර්ණ කිරීම සාර්ථකව ඉටුකර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

| | |
|---|---|
| 5 ශ්‍රේණිය ශිෂ්‍යත්වය | 2014 වර්ෂයේදී සමත්වීමේ ප්‍රතිශතය සියයට 29.3 ක් වූ අතර, එය 2016 දී සියයට 8 දක්වා පහත බැස තිබුණි. |

| | |
|---|---|
| අ.පො.ස. (සා.පෙළ) | 2013 වර්ෂයේ ගණිතය සමත්වීමේ ප්‍රතිශතය සියයට 55 ක් වූ අතර, 2015 දී සියයට 47 ක් වී තිබුණි. |
| අ.පො.ස. (උසස් පෙළ) | විශ්ව විද්‍යාල සඳහා 2015 වර්ෂයේදී එක් ශිෂ්‍යයෙකු සුදුසුකම් ලැබ තිබුණු අතර, 2014 වර්ෂයේදී භෞතික විද්‍යාවට එක "C" සමාර්ථයක්ද, 2015 දී කෘෂි විද්‍යාවට එක "C" සාමාර්ථයක්ද පමණක් ලබා තිබුණි. |

(ආ) ස්ථානමාරුවීම්නොලබාවර්ෂ 8 සිට 24 දක්වාසේවාකාලයක්පාසැලේසේවයකරන ගුරුභවතුන් සංඛ්‍යාව 15 දෙනෙකු විය. පාසැලේ ගුරු ඌණතාවය 20 ක් හා අතිරික්ත සංඛ්‍යාව 07 ක් ලෙස හඳුනාගෙන තිබුණි.

(ඇ) පාසැලේ ප්‍රසම්පාදන කටයුතුවලදී ප්‍රසම්පාදන උපදෙස් අනුව කටයුතු කර නොතිබුණු අතර, අදාල ලදුපත් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

05. බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලය

---------------------------------------

(අ) සමස්ථ ගුරුමණ්ඩලයෙන් සියයට 32 ක්වූ ගුරුභවතුන් 60 දෙනෙකු වර්ෂ 8 කට වැඩි කාලයක් ස්ථාන මාරුවීම් නොලබා මෙම පාසැලේ සේවය කරමින් පැවතුණි. පාසැලේගුරුභවතුන් 18 දෙනෙකුගේ ඌණතාවයක් හා ගුරුභවතුන් 27 දෙනෙකුගේ අතිරික්තයක් විය.

(ආ) පළමු ශ්‍රේණියේ සිට පහ ශ්‍රේණිය දක්වා සමාන්තර පන්ති 4 බැගින් තිබුණු අතර, 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සමාන්තර පන්ති 8 බැගින් පැවතුණි. මෙම පන්ති සියල්ලෙහි සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 2,960 ක්වුවද, එම සීමාව ඉත්මවා 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 2008/37 දරන චක්‍රලේඛයට අනුකූල නොවන අයුරින් සිසුන් 121 දෙනෙකු සිටින බව නිරීක්ෂණය විය.

(ඇ) පාසැලේ පුස්තකාලයෙන් අස්ථාන ගතවී තිබුණු පුස්තකාල පොත් 3,615 ක් පරිග්‍රහණ ලේඛනයෙන් ඉවත් කිරීමට 2013 ජුලි 04 දින පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලයෙන් ඉල්ලීමක් කර තිබුණද ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි.

(ඇ) 2016 වර්ෂයට අදාලව 6 වැනි ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා වැඩිපුර ඇණවුම් කර තිබුණු පෙළපොත් 4,056 ක් ගබඩාවේ ඉතිරිව තිබුණි. පෙළපොත් තොග ලේඛනයක් සකස්කර හෝ යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඉ) 2013 වර්ෂයේ සිට 2016 දක්වා එකතුව රු. 6,097,500 ක පාසැල් සංවර්ධන සමිති සාමාජික මුදල්ද, භිහ පහසුකම් ගාස්තු රු. 152,100 ක්ද අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඊ) 2015 දෙසැම්බර් 31 දිනැති අංක 35/2015 දරන චක්‍රලේඛය මගින් ලබාදී තිබුණු උපදෙස්වලට අනුකූලව පාසැලේ ආපනශාලාව පවත්වාගෙන ගොස් නොතිබුණි.

06. රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලය

--------------------------------------------------

(අ) රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලයේ විදුහල්පති විසින් 2015 ජනවාරි 29 දිනැති අංක 05/2015 චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන අයුරින් 2014 දී බඳවාගෙන තිබුණු 6 වසර සිසුන් 51 දෙනෙකුගෙන් එක් අයකුගෙන් රු. 5,000 බැගින් එකතුව රු. 255,000 ක් වූ මුදලක් ලදුපත් නිකුත් නොකර එකතු කර තිබුණු අතර, එම මුදල් පාසැල් සංවර්ධන අරමුදල් ගිණුමේ තැන්පත් කර නොතිබුණි.

(ආ) 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 2008/37 දරන චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි 2016 වසරේදීසිසුන් 08 දෙනෙකු අතරමැදි පන්ති සඳහා ඇතුලත් කර තිබුණි.

(ඇ) පාසැලේ වර්ෂ 08 සිට 32 දක්වා කාලයක් ස්ථානමාරු නොලැබූ ගුරුභවතුන් 27 ක් වූ අතර, එය මුළු ගුරු මණ්ඩලයෙන් සියයට 24 ක් විය.

(ඈ) 2016 ජනවාරි 07 දිනැති අංක 01/2016 දරන චක්‍රලේඛයේ 12 වන වගන්තිය ප්‍රකාරව සාමාන්‍ය විෂයයන් උගන්වන ගුරුවරුන් සඳහා සතියකට කාලච්ඡේද 35 ක්ද, පන්තිභාරව කටයුතු කරන ගුරුවරුන් සඳහා සතියකට කාලච්ඡේද 33 ක් සහ උසස් පෙළ ප්‍රධාන විෂයයන් උගන්වන ගුරුවරුන් සඳහා සතියකට කාලච්ඡේද 30 ක් ලබාදිය වුවත්,ඊට අනුකූල නොවන අයුරින් 2016 වර්ෂය සඳහා කාල සටහන් ලබාදීමේදී ගුරුවරුන් 38 දෙනෙකු වෙත ඉතා අඩු කාලච්ඡේද ලබාදී තිබුණි.

07. කළුතර තිස්ස මධ්‍ය විද්‍යාලය

---------------------------------

(අ) වහලය දිරාපත්වීම හේතුවෙන් අතහැර තිබුණු පැරණි ගොඩනැගිල්ලක් අළුත්වැඩියා නොකරම විනාශවීමට ඉඩහැර තිබුණි.

(ආ) විද්‍යාලය සතුව අංග සම්පූර්ණ ගෘහස්ථ ක්‍රීඩාංගණයක් පැවතියද, එය නිසි ලෙස නඩත්තු නොකර අතහැර දැමීම නිසා එය ඌණ උපයෝජිතව පැවතුණි.

(ඇ) පාසැලේවිෂයබාහිර,විෂයසමගාමීහා ක්‍රීඩා කටයුතු අඩාල වී තිබුණු අතර, බැඩ්මින්ටන්, ටේබල් ටෙනිස් වැනි ක්‍රීඩා පාසැලෙන් ක්‍රමයෙන් ඉවත්ව යන බවද ශිෂ්‍යභට කණ්ඩායම අහිමි වී තිබුණ බවද, මාධ්‍ය ඒකකය අකර්මන්‍යව පැවති බවද, කිසිදු සංගමයක් සක්‍රීය මට්ටමක නොතිබුණු බවද නිරීක්ෂණය විය.

(ඇ) වර්ෂ 8 කටවැඩිසේවාකාලයක්සහිතස්ථානමාරුනොලැබූගුරුභවතුන් සංඛ්‍යාව 60 ක් වූ අතර, එය සමස්ථ ගුරු මණ්ඩලයෙන් සියයට 57 ක් විය.

(ඉ) ශ්‍රී ලංකා විදුහල්පති සේවයට අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන් ස්ථාන ගත කිරීම් යටතේ පාසැලට එවා තිබූ නියෝජ්‍යවිදුහල්පතිවරුදෙදෙනෙකුසහස්ථානමාරුකර එවා තිබුනියෝජ්‍යවිදුහල්පතිවරියකසමාලෝචිතවර්ෂයඅවසානයදක්වාද ඒ අනුව කටයුතු කර සේවයටවාර්තාකරනොතිබුණි.

(ඊ) විද්‍යාගාරපහසුකම් ප්‍රමාණවත් තත්ත්වයක නොතිබුණු අතර, පහත සඳහන් අඩුපාඩුකම් පැවතුණි.

* වහලදිරාපත්වීඇතුලටවැසිජලයකාන්දුවීම,කෘෂිභාගෘහවිද්‍යා උපකරණ සඳහා විද්‍යාගාර ඉඩපහසුකම් ප්‍රමාණවත් නොවීම හා භෞතික හා රාසායන විද්‍යාගාර ඇතුලත කොටස් පුපුරා ගිලා බැසීමකට ලක් වී තිබීම.

* වසර 6 කපමණ කාලයක් තිස්සේ කල් ඉකුත් වූ රසායන ද්‍රව්‍ය ඉවත් කිරීමට විධිමත් වැඩ පිළිවෙලක් නොයෙදීම හා අවශ්‍ය කරනඋපකරණහාරසායන ද්‍රව්‍ය ප්‍රමාණවත් පරිදි ලැබී නොතිබීම.

08. හුංගම විජයබා ජාතික පාසල

-----------------------------

හුංගම විජයබා ජාතික පාසලේ ප්‍රාථමික අංශයේ සහකාර විදුහල්පති විසින් 2016 වර්ෂයේ නිල ඇඳුම් වවුචර් බෙදාහැරීමේදී චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන අයුරින් කටයුතු කර තිබුණි. ප්‍රාථමික අංශය සම්බන්ධයෙන් නියෝජන හා පැමිණිලි විශාල සංඛ්‍යාවක් විගණනය වෙත යොමුවන අතර,වසර විසි ගණනක් ස්ථානමාරු නොලබා එකම ස්ථානයේ රැඳී සිටීම මෙවැනි ගැටළුකාරී තත්ත්වයන් ඇතිවීමට හේතුවී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

09. මහනුවර කිංස්වුඩ් විද්‍යාලය

-----------------------------

(අ) ස්ථානමාරු නොලැබ වසර 08 කට වැඩි කාලයක් සේවයේ රැඳී සිටින ගුරුවරුන් සංඛ්‍යාව 31 ක්වූ අතර, එය මුළු ගුරු මණ්ඩලයෙන් සියයට 18 ක් විය. ඊට අමතරව පස් දෙනෙකුගේ ගුරු ඌණතාවයක්ද 24 දෙනෙකුගේ අතිරික්තයක්ද විය.

(ආ) 2016 ජනවාරි 07 දිනැති අංක 1/2016 චක්‍රලේඛයේ 12 වගන්තිය ප්‍රකාරව සාමාන්‍ය විෂයයන් උගන්වන ගුරුවරුන් සඳහා සතියකට කාලච්ඡේද 35 ක්, පන්ති භාර කටයුතු කරන ගුරුවරුන් සඳහා සතියකට කාලච්ඡේද 33 ක් සහ උසස් පෙළ ප්‍රධාන විෂයයන් උගන්වන ගුරුවරුන් සඳහා කාලච්ඡේද 30 ක් ලබාදිය යුතුව තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂයේදී මෙන්ම ඉකුත් වර්ෂයේදීද ඊට බොහෝ සෙයින් අඩු කාලච්ඡේද ප්‍රමාණයන් ලබාදී තිබුණි. මීට අමතරව ගුරුභවතුන් 05 දෙනෙකු වෙත කිසිදු කාල සටහනක් ලබාදී නොතිබුණු අතර, ඔවුන් විසින් ලබන වැටුපට සරිලන රාජකාරි කොටසක් ඉටු කරනු ලබන බවට තහවුරු කරගැනීමට නොහැකි විය.

(ඇ) ඉහත චක්‍රලේඛයේ 13 වගන්තිය අනුව සහකාර විදුහල්පතිවරයෙකුට විනාඩි 40 කාලච්ඡේද 12 ක් වත් ඉගැන්වීම් සඳහා ලබාදිය යුතු වුවත්, ඔවුන් වෙත ඉගැන්වීම් සඳහා එකදු කාල පරිච්ඡේදයක්වත් ලබාදී නොතිබුණි.

(ඈ) වසර 10 සිට 23 දක්වා කාල පරාසයක පාසැලේ සේවය කරන අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 08 දෙනෙකු වෙත ස්ථාන මාරුවීම් ලබාදී නොතිබුණි.

(ඉ) 2013 නොවැම්බර් 02 සිට 2016 සැප්තැම්බර් 30 දක්වා ප්‍රධාන පුස්තකාලයෙන් ගුරුභවතුන් 22 ක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 04 ක් ලබාගෙන නැවත

භාරනොදුන් පොත් සංඛ්‍යාව 54 ක් විය. විශ්‍රාම ගිය, ස්ථානමාරු වී ගිය සහ විදේශ ගතවූ නිලධාරීන් 44 දෙනෙකු විසින් ලබාගත් පොත් 146 ක් නැවත භාරදී නොතිබුණු අතර, ඉන් පොත් 25 ක් විශ්‍රාම ගිය එක් නිලධාරියකු ලබාගත් පොත් විය. ඒවා නැවත ලබාගැනීමට හෝ මූල්‍යමය වටිනාකම් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අපොහොසත් වී තිබුණි. ප්‍රධාන පුස්තකාලයේ පොත් 1,130 ක් හා ප්‍රාථමික පුස්තකාලයේ පොත් 53 ක් අපහරණය කළයුතු තත්ත්වයේ පැවතුණු නමුත්, අපහරණය කිරීමට අදාල පියවර ගෙන නොතිබුණි.

10. පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය

----------------------------------

පාසැලේ විද්‍යා විෂය උගන්වන ගුරුභවතකු වෙත 2016 වර්ෂයේදී සතියකට කාලච්ඡේද 18 ක්ද, 2017 දී 14 ක් පමණක්ද ලබාදී තිබුණු අතර, උසස් පෙළ ආර්ථික විද්‍යාව උගන්වන ගුරුවරයෙකු වෙත 2016 සතියකට කාලච්ඡේද 30 ක් ලබාදී තිබුණද 2017 දී එක කාලච්ඡේදයක්වත් ලබාදී නොතිබුණි.

11. අම්බලන්ගොඩධර්මාශෝක විද්‍යාලය

-------------------------------------

අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ සිසු ළමුන් වෙනුවෙන් වේදිකා ගත කර තිබුණු වේදිකා නාට්‍ය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 වසරේදී වේදිකා නාට්‍ය 03 ක් හා 2017 වසරේ විගණිත දිනය දක්වා වේදිකා නාට්‍යය 03 ක් ලෙස වේදිකා නාට්‍යය 06 ක් පාසැලේ රංග ශාලාවේවේදිකා ගතකර ආදායම් උපයාගෙන තිබුණි. එහිදීඑක් නාට්‍යයක්නැරඹීමසඳහා ශිෂ්‍යයකුගෙන් රු. 200 අවමගාස්තුවකසිටරු. 500 හා රු. 1,000 ආදී වටිනාකම්වලින් යුත් ටිකට්පත් අලෙවි කර තිබුණි. සිසුන්ගේරසාස්වාදයඉහලනැංවීම සඳහා මෙම නාට්‍ය සංදර්ශනපාසල්සිසුන්ට නැරඹීමට අවස්ථාව සලසාදීම අරමුණුකරගෙන තිබුණු බැවින්, ප්‍රවේශපත් සඳහා අධික මිලගණන් නියම කර තිබීම පිළිබඳව විගණනයේදී සෑහීමට පත්විය නොහැකි විය.

(ආ) 2016 වසරේ වේදිකාගත කෙරුණු නාට්‍ය 03 න් එක් නාට්‍යයක් සඳහා පමණක් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා තිබුණු අතර, ඉතිරි නාට්‍ය 02 ක සඳහා 2015 ජනවාරි 29 දිනැති අංක 05/2015 චක්‍රලේඛයට අනුකූලව කිසිදු අනුමැතියක් ලබාගෙන නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2013 නොවැම්බර් 28 දිනැති අංක 07/2013 දරන චක්‍රලේඛයෙහි 7.2 වගන්තිය ප්‍රකාරව මූල්‍යමය අරමුදල් රැස්කිරීමේදී පාසල් සංවර්ධන සමිතිය නමින් විධිමත් අනු අංක සහිතව ලදුපතක් නිකුත් කළයුතු බවත්, එහි සෑම ලදුපතකම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිලමුද්‍රාව ඇතුලත් කළයුතු බවත් සඳහන් වන නමුත්, එසේ පාසල් සංවර්ධන සමිතිය නමින් ප්‍රවේශපතක් මුද්‍රණය කර නොතිබුණු අතර, මුද්‍රණය කර තිබුණු ප්‍රවේශපත්වලද කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිල මුද්‍රාව වෙනුවට විදුහල්පතිගේ නිල මුද්‍රාව තැබීමට කටයුතු කර තිබුණි.

(ඈ) පාසල විසින් කරන සියලු ව්‍යාපෘතිවලදී ආදායම් වියදම් දැරීම පාසල් සංවර්ධන සමිතියේ ගිණුම මගින් සිදුවිය යුතු බව 07/2013 චක්‍රලේඛයේ සඳහන් වුවද, මෙම නාට්‍ය සංදර්ශනවලදී ආදායම් රැස්කිරීම හා වියදම් දැරීම පාසල් සංවර්ධන සමිති ගිණුම මගින් සිදුකර නොතිබුණු අතර, අවස්ථා 02 කදී ඉතිරි මුදල් ප්‍රමාණය පමණක් පාසල් සංවර්ධන සමිති ගිණුමට බැර කර තිබුණි. අනෙකුත් නාට්‍ය සංදර්ශන අවස්ථා 04 දීම ලැබී ඇති මුදල් පාසැලට අනුබද්ධ වෙනත් සංවිධාන සතුව තවදුරටත් පවතින බව විගණනයේදී අනාවරණය විය.

(ඉ) මෙම නාට්‍ය සංදර්ශන 06 න් 02 ක් පමණක් පාසල මගින්ද, ඉතිරි නාට්‍ය 04 ම පාසලට අනුබද්ධ සංවිධාන හා ආදි ශිෂ්‍යයන් විසින්ද සංවිධානය කර තිබුණි. 2015 ජනවාරි 29 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 05/2015 දරන චක්‍රලේඛයේ 08 වන වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවද, එවැනි අනුමැතියක් ලබාගත් බවට සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

(ඊ) 2017 මාර්තු 22 දිනැති අංක ED/1/6/1/Projects/2017දරන මාසයකට එකක් විශිෂ්ඨ වේදිකා නාට්‍යයක් "දම්සෝවේදී රඟ දැක්වීම" මැයෙන් අධ්‍යාපන ලේකම්වරයා වෙනුවට ජාතික පාසැල් අධ්‍යක්ෂ විසින් නිකුත් කර තිබුණු ලිපියෙහි සඳහන් අංක 04, 06, 07 හා 08 යන කරුණුවල සඳහන් කර ඇති පරිදි කටයුතු කර නොතිබුණි.

(උ) 07/2013 හා 05/2015 චක්‍රලේඛ මඟින් පාසල්වල අවිධිමත් ලෙස මුදල් අයකිරීම තහනම් කිරීම සඳහා අධ්‍යාපන ලේකම්වරයා විසින් විධිවිධාන පනවා තිබුණි. විදුහල්පතිවරුන් ඇතැම් අවස්ථාවලදී චක්‍රලේඛ උපදෙස් හා මුදල් රෙගුලාසි නිවැරදිව අනුගමනය නොකරන බැවින්, විවිධ අවස්ථාවලදී ඉහත සඳහන්

ආකාරයේ ලිපි මගින් මුදල් අයකිරීමට අවසර ලබාදීම හේතුවෙන් අවිධිමත්ව හා විනිවිදභාවයෙන් තොරව කටයුතු කිරීමට විදුහල්වලට අවස්ථා හා ඉඩකඩ සැලසෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

12. මාතර සුජාතා බාලිකා විද්‍යාලය

-----------------------------------

නියැදි පරීක්ෂාවන්හිදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂයේ පළමු වසර සඳහා ළමුන් ඇතුලත් කිරීමේදී, 2017/2016 චක්‍රලේඛයේ 11.1 (අ) ට අනුකූල නොවන අයුරින් කිසිදු දැනුම්දීමකින් තොරව තාවකාලීන ලේඛනයේ සිටි ළමුන් දෙදෙනෙකුගේ නම් පොරොත්තු ලේඛනයට ඇතුලත් කර තිබුණි.

(ආ) පාසැලට ඇති දුර නිශ්චය කිරීමේදී හා ආසන්න පාසැල්වලට ලකුණු අඩු කිරීමේදී ඒකාකාරී ප්‍රතිපත්තියක් අනුව කටයුතු කිරීමට අභියාචනා මණ්ඩලය කටයුතු කර නොතිබීම මත සුදුසුකම් නොලබා සිටි ළමුන්ට අවස්ථාව සලසා දී තිබුණු අතර, ඒ හා සමානව තවත් ළමුන් වෙත අසාධාරණයක් හෝ අකටයුත්තක් සිදුවන්නට ඉඩ හැර තිබුණි.

(ඇ) මූලික සම්මුඛ පරීක්ෂණවලදී ලකුණු ලබාදී තිබුණු ප්‍රතිපත්තියට අනුකූල නොවන ලකුණු අභියාචනාවලදී ලබාදීමට කටයුතු කිරීම හේතුවෙන්, මුල් සම්මුඛ පරීක්ෂණවලට පෙනී සිටි ළමුන්ට අසාධාරණයක් හෝ අකටයුත්තක් සිදුවීමට ඉඩ හැර තිබුණි.

(ඈ) එසේ අසාධාරණයට හෝ අකටයුත්තට පත් ළමුන්ට සාධාරණයක් ඉටුකිරීම සඳහා 2017 අගෝස්තු 30 දින දක්වාද අපොහොසත්වී තිබුණි.

13. විදුහල්පති පුරප්පාඩු

----------------------

2017 මැයි මස අවසාන වන විටද ජාතික පාසැල් 352 න් පාසැල් 228 ක විදුහල්පති ධුර පුරප්පාඩු වී පැවතුණ අතර, ඒ සඳහා වැඩ බලන හෝ රාජකාරී ආවරණ පත්කිරීම් සිදුකර තිබුණි.

14. ශ්‍රී ලංකා විදුහල්පති සේවය
--------------------------------

නියැදි පරීක්ෂාවන්හිදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2014 ඔක්තෝබර් 22 දිනැතිඅංක 1885/31 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථා අනුව 2016 දෙසැම්බර් 31 දින වන විට අන්තර්ග්‍රහණය කර තිබුණු නිලධාරීන් සංඛ්‍යාව 12,160 ක් විය. අනුමත නිලධාරී සංඛ්‍යාව 16,512 ක් වූ අතර, තථ්‍ය සංඛ්‍යාව 13,517 ක් වූ බැවින් තවත් 1,357 ක් අන්තර්ග්‍රහණය කළයුතුව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී විදුහල්පතිවරු 352 දෙනෙකු විශ්‍රාම ගොස් තිබුණු අතර, ඉන් ලිපිගොනු 42 ක සිදුකළ සෝදිසි විගණන පරීක්ෂාවට අනුව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) නිලධාරීන් 22 දෙනෙකුගේ විශ්‍රාම ගැන්වීමේ ලිපි දින 18 සිට මාස 9 දක්වා කාල පරාසයක් ප්‍රමාද කර යවා තිබුණි. ඒ අනුව විශ්‍රාම යන නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීම නියමිත දිනට සිදුනොවීමේ ප්‍රමාණය සියයට 52 ක් පමණ විය.

(ii) විශ්‍රාම යනනිලධාරියාවිසින් විශ්‍රාම යාමටඉදිරිපත්කළ ලිපිය කලාප හෝ පළාත් අධ්‍යාපන කාර්යාල මඟින් නිර්දේශ කර විශ්‍රාම යාමට මාස දෙකකට පෙර විදුහල්පති ශාඛාව වෙත ඉදිරිපත් කර තිබුණද, විශ්‍රාම ගැන්වීමේ ලිපි බොහෝ සේ ප්‍රමාද කර නිකුත් කර තිබුණි. ප්‍රමාදයට බලපෑ විශේෂ හේතු කිසිවක් තිබුණු බව ලිපිගොනු පරීක්ෂාවේදී නිරීක්ෂණය නොවීය.

(iii) 1999 අගෝස්තු 18 සිට සේවයෙන් පහකර තිබුණු කෑගල්ල ප්‍රාථමික විද්‍යාලයක වැඩ බලන ලද විදුහල්පතිවරයෙකු ඒ පිළිබඳව මහජන පෙත්සම් කාරකසභාවට පැමිණිලි කර තිබුණි. ඒ සම්බන්ධයෙන් 2012 හා 2014 වර්ෂවල අමාත්‍යාංශයෙන් තොරතුරු විමසා තිබුණි. එම තොරතුරු යවන ලද බවට සනාථ කිරීම සඳහා සාක්ෂි කිසිවක් ලිපිගොනු පරීක්ෂාවේදී නිරීක්ෂණය නොවීය.

(iv) මහජන පෙත්සම් කාරක සභාව විසින් පෙත්සම් කරුවකු සම්බන්ධයෙන් 2016 ජනවාරි 06 ඉල්ලා තිබුණු තොරතුරු විදුහල්පති ශාඛාව විසින් 2017 පෙබරවාරි අවසන් වනතුරුත් යවා තිබුණු බවට සාක්ෂි නොවීය.

(v) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2-1 ශ්‍රේණියේ නිලධාරියකු විශ්‍රාම ගැන්වීම සඳහා ලිපිගොනුව විදුහල්පති ශාඛාවට ලැබී වර්ෂ 1 ½ කට අධික කාලයක් ගතවී තිබුණද, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් තොරතුරු ලබාගෙන නොතිබීම විගණනයේදී ප්‍රශ්නගත විය.

15. 2016 දෙසැම්බර් 31 දින වන විට ජාතික පාසැල් 53 ක ගිවිසුම් ප්‍රකාරව අයකර නොතිබුණු ආපන ශාලා හිඟ ආදායම රු. 5,269,609 ක් විය.

16. තම පාසැල්වල හෝ අවට පාසැල්වල හෝ ප්‍රමාණවත් ශ්‍රවණාගාර හෝ ශාලා පහසුකම් තිබියදී ජාතික පාසැල් 20ක විවිධ උත්සව සඳහා පෞද්ගලික ආයතන සතු ශ්‍රවනාගාර හෝ ශාලා පහසුකම් ලබා ගැනීම සඳහා 2016 වර්ෂය තුළදී වැයකර තිබුණු මුළු මුදල රු. 7,279,029 ක් විය.

17. ජාතික පාසැල් 25 ක ගුරුභවතුන්346 දෙනෙකු වෙත බැහැර දුන් පොත් ආපසු ලබාදීම ප්‍රමාද වූ අවස්ථා 521ක් වූ නමුත් ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.

18. ජාතික පාසැල් 35ක ගුරුභවතුන් 243දෙනෙකු ස්ථාන මාරුවීම්, විදේශගත වීම්, විශ්‍රාමයාම් හා සේවයෙන් ඉවත්වීම් වැනි අවස්ථාවලදී ආපසු භාරදී නොතිබුණු පොත් සංඛ්‍යාව 605 ක් වූ අතර, එහි වටිනාකම රු. 522,181 ක් විය. එම පොත් හෝ ඒවායේ වටිනාකම හෝ ආපසු ලබා නොගෙන එම ගුරුභවතුන් සේවයෙන් නිදහස් කර තිබුණි.

19. 2016 දෙසැම්බර් 31 දින වන විට ජාතික පාසැල්52 ක පාසැල් සංවර්ධන සමිතියෙන් හෝ නේවාසිකාගාර අරමුදලින් හෝ පහසුකම් හා සේවා ගාස්තු ගිණුමෙන් හෝ ක්‍රීඩා අරමුදල් වලින් හෝ වැටුප් ගෙවමින් බඳවා ගෙන තිබුණු අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව 307 ක් විය. ඔවුන් වෙත 2016 වර්ෂය තුළදී පමණක් ගෙවා තිබුණු මුළු වැටුප් හා දීමනා රු. 5,781,742 ක් වූ අතර, එය සම්පූර්ණයෙන්ම සිසුන් මත පැටවුන වැය බරක් විය.

20. 2016 දෙසැම්බර් 31 දිනට ජාතික පාසැල් 65 ක අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 360 දෙනෙකුගේ අතිරික්තයක් සහ ජාතික පාසැල් 147 ක 1440 දෙනෙකුගේ ඌනතාවයක් විය.

21. 2016 වර්ෂය තුළදී ගුණාත්මක යෙදවුම් මිලදී ගැනීම සඳහා ජාතික පාසැල් 105 ක් වෙත ලබාදී තිබුණු රු. 20,808,668 කින් රු. 10,556,724 ක් 2016 දෙසැම්බර් 31 දින වන විට ඉතිරිව තිබුණු අතර, එම මුදල් පාසැල් සංවර්ධන සමිති ජංගම ගිණුම්වල පැවතුණි.

22. ජාතික පාසැල් 36 ක් විසින් විවිධ අවස්ථාවන්හීදී නිකුත් කර තිබුණු රු.7,402,694 කතත්කාර්ය අතුරු අග්‍රිම 2016 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

23. 2016 වාර්ෂික විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු කැඳවමින් 2017 පෙබරවාරි 06 දින යවන ලද ලිපියට ජාතික පාසැල් 125 කින් 2017 ජුනි 20 දින දක්වාත් පිළිතුරු සපයා නොතිබුණු අතර,2015 වාර්ෂික විගණනය සඳහා තොරතුරු කැඳවමින් 2016 පෙබරවාරි 15 දින යවන ලද ලිපියටද ජාතික පාසැල් 71 කින් පිළිතුරු සපයා නොතිබුණි. මේ අතර වසර දෙක සඳහාම පිළිතුරු එවා නොතිබුණු පාසැල් 47 ක් තිබුණි.

3.13 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල කාර්යසාධනය
-----------------------------------------------

සිදුකරන ලද සෝදිසි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ කරුණු පහත සඳහන් වේ.

(අ) නිල්වලාජාතිකඅධ්‍යාපන විද්‍යාපීඨය
-----------------------------------------

i. නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට අයත් තනතුරු 13 ක පුරප්පාඩු 45 ක්ද, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 16 ක පුරප්පාඩු 30 ක්ද පැවතුණු අතර, අනධ්‍යයන කාර්යමණ්ඩල තනතුරු 05 කට අදාලව අතිරික්ත කාර්ය මණ්ඩල 06 ක් විය. කාථිකාචාර්යවරුන් 09 දෙනෙකු වසර 14 සිට 22 දක්වා කාල පරාසයක් මෙම විද්‍යාපීඨයේම සේවය කරමින් පැවතුණි.

ii. නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයත් හෙක්ටයාර් 0.06310 ක ඉඩම් ප්‍රමාණයක ඉඩම් කොටස් 04 ක බාහිර පුද්ගලයන් 03 දෙනෙකු අනවසරෙන් පදිංචි වී තිබුණි.

(ආ) ඌවජාතිකඅධ්‍යාපන විද්‍යාපීඨය - බණ්ඩාරවෙල
-------------------------------------------------------

i. 2014 ජුනි 24 දිනඉන්දියානුආධාරයටතේ විද්‍යාපීඨයට ලැබී තිබුණු පරිගණක 31 ක්ද සමග වූ අංග සම්පූර්ණ භාෂාගාරය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වසර දෙකක් පමණ ඵලදායී අයුරින් භාවිතා නොකර වසා දමා තිබුණි.

ii. 2015 ජනවාරි 05 දින විද්‍යාපීඨයට ලැබී තිබුණු රෝද ට්‍රැක්ටරය විගණිත දින දක්වාම ලියාපදිංචි කර හෝ භාවිතයට ගෙන නොතිබුණු අතර, අක්කර 27 කට ආසන්න භූමි ප්‍රමාණයක් විද්‍යාපීඨය සතුව පැවතුණු නමුත්, එම භූමියෙන් 2/3 ක් පමණ ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගන්නා බවට සාක්ෂි නොතිබුණි. නිල නිවාස දෙකක් ඉතා අබලන් තත්ත්වයේ පැවතුණි.

iii. 2016 වර්ෂයවෙනුවෙන්රු. 2,291,651 ක ප්‍රසම්පාදනයන් සිදුකිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) පේරාදෙණියජාතික අධ්‍යාපන විද්‍යාපීඨය
---------------------------------------------

i. විද්‍යාපීඨය සඳහා අනුමත කාර්ය මණ්ඩලය 151 ක් වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 61 ක් වූ බැවින්, එය මුළු අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 40 ක් පමණක් විය. දෙමළ මාධ්‍ය කිසිදු ස්ථිර කථිකාචාර්යවරයෙකු නොසිටි බැවින්, බාහිර කථිකාචාර්යවරු දෙදෙනෙකු එම විෂය ආවරණය කරනු ලබන බව නිරීක්ෂණය විය.

ii. ගුරු අධ්‍යාපනඥ සේවයේ උසස්වීම් පරිපාටිය නිසි අයුරු අප්‍රමාදව ක්‍රියාත්මක නොවීම, වෘත්තීය ධාරිතා සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් ප්‍රමාණවත් පරිදි ලබා නොදීම, ප්‍රමාණවත් පරිගණක හා අන්තර්ජාල පහසුකම් නොමැතිවීමහා දුරකථන දීමනා ලබාදීමට අධ්‍යාපන අමාත්‍යාංශය සමාලෝචිත වර්ෂය අවසාන වනතුරුත් අපොහොසත් වීම ආදී කරුණු හේතුවෙන් නිලධාරීන් අපහසුතාවයට පත්වී තිබුණු බව නිරීක්ෂණය විය.

iii. විද්‍යාපීඨය සතු අක්කර 03 කට වැඩි භූමි ප්‍රමාණයක් 2001 මැයි මස සිටම අනවසර පදිංචිකරුවන් පදිංචිව සිටින නමුත්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඔවුන් ඉවත් කිරීමට අපොහොසත් වී තිබුණි.

iv. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය විසින් 2011 නොවැම්බර් 24 දින ආරම්භ කර තිබුණු ශ්‍රවණාගාරය හා යාබද පන්ති කාමර ඉදිකිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වනතුරුත් සම්පූර්ණ කර නොතිබුණි.

v. රු.3,897,350 ක කොන්ත්‍රාත් මිලකට භාරදී තිබුණු මාර්ග පද්ධතිය අළුත්වැඩියාව හා වැඩි දියුණු කිරීම් කටයුතු සහ බොහෝ ව්‍යාපෘති නියමිත ප්‍රමිතියෙන් යුක්තව සිදුකර නොතිබුණු බවත්, ඒවා පිළිබඳ නිසි අධීක්ෂණයක් සිදුකර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

vi. විද්‍යාපීඨයේ පවතින නිල නිවාස 9 න් 8 ක්ම අළුත්වැඩියා කළයුතු මට්ටමේ පැවතුණි. H– 01 නිල නිවාසය ගරා වැටීමට ආසන්න තත්ත්වයේ පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර,H– 10 නිල නිවාසය 2011 වර්ෂයේ සිටම බාහිර පුද්ගලයකු අනවසරයෙන් පදිංචි වී සිටි බව නිරීක්ෂණය විය.

vii. විද්‍යාපීඨය සතුව අධි ශ්‍රේණියේ පුස්තකාලයක් පැවතුණ අතර, දිනපතා සිසුන් 200 කට ආසන්න ප්‍රමාණයක් එය පරිහරණය කරන බව නිරීක්ෂණය විය. භූගෝල විද්‍යාව විශේෂ උපාධිධාරී සංවර්ධන නිලධාරියෙක් පුස්තකාලයාධිපති ලෙස කටයුතු කරමින් සිටි අතර, පුස්තකාල කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබුණි.

viii. පුස්තකාලයේ පැරණි පරිග්‍රහණ ලේඛනවල සඳහන් පොත්වල නම් ඉදිරියෙන් රතු පෑනෙන් කපා දමා තිබුණ නමුත් කුමන හේතු මත එසේ සිදුකර තිබුණිද සිදුකර තිබුණිද යන්න සටහන් කර නොතිබුණි. මීට පෙර පුස්තකාලය භාරව සිටි නිලධාරීන් තිදෙනෙකු පමණ පුස්තකාල වත්කම් විධිමත් පරිදි භාරදීමට හා භාරගැනීමට කටයුතු කර නොතිබුණු අතර පොත් අස්ථාන ගතවීම හේතුවෙන් එම එක් නිලධාරිණියකගෙන් මුදල් අවකරණ සිදුකර තිබුණි. කාගේ වරදක් හේතුවෙන් පොත් අස්ථාන ගතවී තිබුණිද යන්න තහවුරු කිරීමට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ හෙයින් එම අවකරණ ක්‍රියාවලියේ නිරවද්‍යතාවය තහවුරු කිරීමට විගණනයේදී නොහැකි විය.

3.14 පිරිවෙන් කාර්යසාධනය
---------------------------

නියැදි පරීක්ෂාවන්හිදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 1980 ඔක්තෝබර් 01 දිනැති අංක 108/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පිරිවෙන් සඳහා නිකුත් කර තිබූ නියෝග මාලාව පරීක්ෂාවේදීබොහෝමයක් පිරිවෙන් එම නියෝග මාලාවේ නියෝගවලට අනුකූල නොවන ආකාරයට කටයුතු කරනු ලබන බව නිරීක්ෂණය විය.

(ආ) පිරිවෙන් කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------------

i. 2016 දෙසැම්බර් 31 දිනට පිරිවෙන් 754 ක් ලියාපදිංචි වී ඇති අතර, එහි ගිහි පැවිදි සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව 66,003 ක් බවට විගණනය වෙත තොරතුරු ලබාදී ඇත. ගිහි පැවිදි අනුමත ගුරුභවතුන් සංඛ්‍යාව 6,503 ක් වන අතර, අනුමත නොවූ ගුරුභවතුන් සංඛ්‍යාව 306 කි. 1980 ඔක්තෝබර් 01 දිනැති අංක 108/6 දරන නියෝග මාලාවේ 16. 3 වගන්තිය ප්‍රකාරව වාර්ෂික පැමිණීමේ ශිෂ්‍ය සාමාන්‍ය අගය ගැලපීමේදී එදිනට ගුරු අතිරික්තය දළ වශයෙන් 1,700 ක් පමණ වන බව නිරීක්ෂණය විය. එවැනි ගුරු අතිරික්තයක් පවතිද්දී 2017 පෙබරවාරි 14 දින නැවත ගුරුභවතුන් 199 ක් වෙත (පැවිදි ගුරුභවතුන් 122 ක් සහ ගිහි ගුරුභවතුන් 77 ක් වශයෙන්) පත්වීම් ලබාදී තිබීම විගණනයේදී ගැටළු සහගත විය.

ii. පිරිවෙන් සඳහා ගුරුභවතුන් බඳවාගැනීමේදී කෘත්‍යාධිකාරී හිමියන් විසින් නිර්දේශ කර පිරිවෙන් ශාඛාව වෙත එවනු ලබන අයදුම්කරුවන් පිළිබඳ පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය අනුමත කිරීමෙන් පසු පත්වීම් ලබාදීම සිදුවුවද අධ්‍යාපන සහතිකවල නිවැරදිතාවය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් හෝ පිරිවෙන් ශාඛාව මගින් පරීක්ෂා කිරීමක් සිදු නොකරන බව නිරීක්ෂණය විය.

iii. 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26, 27 හා 33 වෙනි වගන්ති යටතේ අධ්‍යාපන අමාත්‍යවරයා හා පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලයේ එකඟතාවෙන් සෑදූ 1980 ඔක්තෝබර් 01 දිනැති අංක 108/6 නියෝග මාලාවේ 16 (03) වගන්තිය ප්‍රකාරව පිරිවෙනේ ගුරුභවතුන් රඳවාගැනීම ශිෂ්‍ය සාමාන්‍යය පදනම් කරගෙන සිදුකළ යුතුව ඇත. ඒ අනුව පිරිවෙන්වල ශිෂ්‍ය සංඛ්‍යා ප්‍රමාණය පහළ යාමත් සමඟ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය රැකගැනීමට ගුරුභවතුන් රඳවාගැනීමට හා

පිරිවෙන් ආයතනවල ස්වභාවය පරිදි සමාන්තර විෂයයන් අනුව ගුරුවරුන් බඳවාගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කළ යුතු බව නිරීක්ෂණය විය.

(ඈ) පිරිවෙන් අධ්‍යාපන ක්‍රමයේ වර්තමාන දුර්වලතා සහ පිරිවෙන් අධ්‍යාපනය පිරිහීමටබලපා තිබුණුහේතු වශයෙන් නිරීක්ෂණය කරන ලද කරුණු ගණනාවක් කෙටුම්පත් වාර්තාවෙන් ඉදිරිපත් කර ඇත.

(ඈ) විගණන අවස්ථාව වන විට ගිණුම් ශාඛාවේ තොරතුරු අනුව 2015 වර්ෂයට අදාල වාර්ෂික ආධාර මුදල් ගෙවීමට අනුමත වූ එහෙත් වාර්ෂික ආධාර මුදල් ගෙවා නොමැති පිරිවෙන් සංඛ්‍යාව 60 ක් වූ අතර, 2015 වර්ෂය සඳහා ගෙවිය යුතු වාර්ෂික ආධාර මුදල රු. 18,243,465 ක් විය

(ඉ) පිරිවෙන් ශාඛාවේ සහකාර අධ්‍යක්ෂ හිමිවරුන් 18 නමක්, පිරිවෙන් සම්බන්ධීකාරක හිමිවරුන් 12 නමක් හා වැඩසටහන් සම්බන්ධීකාරක එක් නිලධාරියෙකු පමණක් සිටින බැවින් දිවයින පුරා පිහිටි පිරිවෙන් 757 ක ප්‍රමාණයක් විධිමත් පරිදි පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති විය.

ශාඛා ප්‍රධානි, රාජ්‍ය කළමනාකරණ සහකාර, සංවර්ධන සහකාර, ලේඛන සහකාර හා කාර්යාල කාර්ය සේවක යන නිලධාරීන් වෙත විධිමත් ලිඛිත රාජකාරී පැවරීම් පිළිබඳ සාක්ෂි ඉදිරිපත් නොවීය.

විෂය උපදේශකවරුන් හා ගුරු උපදේශකවරුන් ලෙස වෙනත් පිරිවෙන්වල රාජකාරි කරනු ලබන පරිවේණාචාර්යවරුන් 14 ක් පිරිවෙන් ශාඛාවට අනුයුක්තව 2012 ජනවාරි 01 සිට විගණන අවස්ථාව දක්වා විවිධ කාල පරාසයක් තුල රාජකාරි සිදුකලද, වැටුප් ගෙවීම් අදාල පිරිවෙන් මගින් සිදුකරනු ලබන බව නිරීක්ෂණය විය. දීර්ඝ කාලයක් තිස්සේ අනුයුක්ත රාජකාරි සිදුකිරීම හේතුවෙන්  සේවය කෙරෙහි අවිනිශ්චිතභාවයක් හා තම උපරිමයෙන් රාජකාරි සිදුකිරීම පිළිබඳ විශ්වාසවන්තභාවයක් නොමැතිවීම නිසා ඵලදායී හා ගුණාත්මක සේවයක් ඔවුන්ගෙන් ලබාගැනීම අපහසු වන බවත්, නිලධාරීන් තම රැකියාව කෙරෙහි තෘප්තිමත්  ආකල්පයක් නොදරන බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 4.13 ඡේදය ප්‍රකාරව පිරිවෙන් අධ්‍යාපන මණ්ඩල යටත් පිරිසෙයින් සෑම මාස 3 කට වරක්වත් රැස්විය යුතු වුවද, 2015 හා 2016 වර්ෂයන්වල ඒ අනුව රැස්වී නොතිබුණි.

(උ) අමාත්‍යාංශයේ විවිධ ශාඛා මඟින් පාසැල් ගුරුභවතුන් වෙත ලබාදෙන දේශීය හා විදේශීය ගුරු පුහුණු වැඩසටහන් පිරිවෙන්වල ගුරුභවතුන් වෙත ලබා නොදෙන බව නිරීක්ෂණය විය.

(ඌ) අයවැය ඇස්තමේන්තු සහ සැලසුම්කරණය

---

2017 වර්ෂය සඳහා පිරිවෙන් අධ්‍යාපනය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන ලබාදුන් ආකාරය පහත පරිදි වේ.

| විෂය | ඉල්ලුම් කරන ලද මුදල (රු.මිලියන) | ලැබුණු මුදල (රු.මිලියන) |
|---|---|---|
| ප්‍රාග්ධන වියදම් | 758.0 | 80 |
| පුනරාවර්තන වියදම් | 341.5 | 260 |
| 2017 අයවැය යෝජනා මඟින් | - | 50 |
| | 1099.5 | 390 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. ඉල්ලුම් කරන ලද මුදල්වලින් සියයට 35 ක් පමණක් ලැබී තිබුණු අතර, ප්‍රාග්ධන වියදම් සඳහා අපේක්ෂිත මුදලින් සියයට 10 ක පමණ අඩු ප්‍රතිපාදනයක් පමණක් ලැබී තිබීම හේතුවෙන් පිරිවෙන් අධ්‍යාපනය නැංවීම සඳහා එය ප්‍රමාණවත් වී නොතිබුණි.

ii. 2017 අයවැය ප්‍රතිපාදන මඟින් පිරිවෙන් ගුරුභවතුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා රු. මිලියන 50 ක් ලැබී තිබුණද එම පුහුණු වැඩ සටහන් සඳහා විධිමත් සැලසුමක් සකස්කර නොතිබුණු අතර, ප්‍රාග්ධන හා පුනරාවර්තන ප්‍රතිපාදන වියදම් කිරීම සඳහා විධිමත් වැඩ සැලසුමක් 2017 අගෝස්තු 30 දක්වාත් සකස් කර නොතිබුණි.

(එ) පිරිවෙන් සඳහා විවිධ පොත් මිලදී ගැනීම හා බෙදාහැරීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. 2017 ජනවාරි 13 පිරිවෙන් ශාඛාවේ ගබඩා කාමරය පරීක්ෂාවේදී වටිනාකම රු. 4,090,624 ක් පමණ වන විවිධ කතෘවරුන් 166 කට අදාළ පොත් විශාල සංඛ්‍යාවක් බෙදා නොහැර පැවති බව නිරීක්ෂණය විය.

ii. පිරිවෙන් අධ්‍යාපනය සඳහා අනන්‍ය වූ පොත් හැර අනෙකුත් පොත් සඳහා ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලයේ අනුමැතිය ලැබිය යුතු වුවද, බොහොමයක් පොත් සඳහා අනුමැතිය ලැබී නොතිබුණි.

(ඊ) නැගෙනහිරපළාතේමුලතිව්දිස්ත්‍රික්කයේ එක් මූලික පිරිවෙනක්ද, වව්නියාව දිස්ත්‍රික්කයේ එක් විද්‍යායතන පිරිවෙනක්ද හැර උතුර පළාතේ පිරිවෙන් ආරම්භ කර නොතිබුණි.

3.15 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු
----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය තුළදී ගුණාත්මක යෙදවුම් මිලදී ගැනීම සඳහා ජාතික පාසැල් 40 ක් වෙත ලබාදී තිබුණු රු.2,748,592 කින් රු.1,475,910 ක් අදාල ගුණාත්මක යෙදවුම් සඳහා යොදාගෙන නොතිබුණු බැවින් 2015 දෙසැම්බර් 31 දින වන විට පාසැල් සංවර්ධන සමිති ජංගම ගිණුම්වල ඉතිරිව තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට ජාතික පාසැල් 43 ක පාසැල් සංවර්ධන සමිතිවලට අයත් එකතුව රු. 633,803,600 ක් වූ මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

3.16 අමාත්‍යාංශයේ කළමනාකරණ ක්‍රියාකාරකම්
--------------------------------------------

අමාත්‍යාංශය විසින් ප්‍රමාණවත් පරිදි කළමනාකරණ තීරණ නොගැනීම හේතුවෙන් පහත සඳහන් දූර්වලතා සිදුවී ඇති බව නිරීක්ෂණය විය.

(අ) පළාත් 9 තුල විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ගේ අධ්‍යාපන සංවර්ධනය සඳහා ජාතික හා පළාත් මට්ටමේ සම්පත් හාතොරතුරු මධ්‍යස්ථාන පිහිටුවීමට 2007 වර්ෂයේ සිටම අධ්‍යාපන අමාත්‍යාංශය සැලසුම් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිම කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) පාසැල් සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීම
------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. ඩයලොග් සමාගම හා ලංකා ටෙලිකොම් සමාගම විසින් 2005 වසරේ සිට පාසැල් පරිගණක ජාලයට සම්බන්ධිතව ලබාදී තිබුණු අන්තර්ජාල පහසුකම් සංඛ්‍යාව 1,724 ක් විය. 2016 වසරේදී එම අන්තර්ජාල පහසුකම් අත්හිටුවීමට අමාත්‍යාංශය තීරණය කර තිබුණි.

ii. 2016 ජුලි 01 දින සිට 2017 පෙබරවාරි දක්වා මෙම සමාගම් දෙක වෙත කිසිදු මුදලක් ගෙවා නොතිබුණු අතර, ගෙවිය යුතුව තිබුණු මුළු මුදල රු. 91,221,972 ක් විය. 2016 වර්ෂයේදී ඩයලොග් සම්බන්ධතා 123 ක් හා ටෙලිකොම් සම්බන්ධතා 910 ක් විසන්ධි කර තිබුණු අතර, කිසිදු පාසැලක් වෙත 2017 ජුනි අවසන දක්වාත් නව අන්තර්ජාල පහසුකම් ලබාදී නොතිබුණි. ඩයලොග් සමාගම විසින් පාසැල් 192 ක් සඳහා ලබාදී තිබුණු සබඳතා රු.1,500 ක මාසික ගාස්තුවක් යටතේ නව සබඳතා බවට පරිවර්තනය කිරීමේ කටයුතු පමණක් ආරම්භ කර තිබුණු බව විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරුවල සඳහන් විය.

iii. ඉහත සඳහන් ගෙවීම්වලට අමතරව ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම වෙත 2016 ජුලි 01 දිනෙන් පසුව වෙබ් ෆිල්ටරින් සේවාව ලබාගැනීම වෙනුවෙන් 2016 ජුලි සිට 2017 පෙබරවාරි දක්වා ගෙවිය යුතුව තිබුණු මුදල රු. 1,087,481 ක් විය.

iv. 2017 ජනවාරි මස සිට නව සබඳතා ලබාදීමට කටයුතු කරන බව දන්වා තිබුණි.

(ඇ) පස්වන ශ්‍රේණි ශිෂ්‍යත්වධාරීන්ට ශිෂ්‍යාධාර ගෙවීම

-------------------------------------------------

පස්වන ශ්‍රේණි ශිෂ්‍යත්වධාරීන්ට ශිෂ්‍යාධාර ගෙවීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2006 ජුනි 20 නිකුත් කර තිබුණු අංක 2006/27 දරන චක්‍රලේඛයේ 8.2 හි සඳහන් පරිදි, නියමිත කාලය තුල අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ලැබී නොතිබීම හා පාසැලෙන් වවුචර්පත් නොලැබීම යන හේතු නිසා 2015වර්ෂය වෙනුවෙන් ජාතික පාසැල් 09ක් සඳහා රු. 211,000 ක් වටිනා ශිෂ්‍යාධාරද, 2016 වර්ෂය වෙනුවෙන් ජාතික පාසැල් 28 ක් සඳහාශිෂ්‍යාධාර සමාලෝචිත වර්ෂය අවසානය වන විටද ගෙවා නොතිබුණි. ඉදිරියේදී පරිගණක ගත ක්‍රමයකට ලැබිය යුත්තා වෙතම අදාල ශිෂ්‍යාධාර ලැබෙන ලෙස පද්ධතියක් සකස් කරමින් පවතින බව දන්වා තිබුණි.

(ඇ) නිලඇඳුම් හා වවුචර්පත්

----------------------------

1993 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා නොකඩවා දිවයිනේ සියළුම පාසැල් ළමුන් වෙත නිල ඇඳුම් සඳහා රෙදි ලබාදී තිබුණු අතර, 2016 වර්ෂයේදී වවුචර්පත් ක්‍රමයට මාරුවීමට කටයුතු කර තිබුණි.

i. 2016 වර්ෂය සඳහා නිලඇඳුම් රෙදි වෙනුවට වවුචර්පත් බෙදාදීමේ කටයුතු 2015 වර්ෂයේ අවසාන භාගයේ ආරම්භ කර තිබුණු අතර, ප්‍රතිලාභීන් සංඛ්‍යාව 4,342,381 ක් ලෙස හඳුනාගෙන තිබුණි. එය ඉකුත් වර්ෂයේ සංඛ්‍යාව වූ 4,520,878 වඩා, සියයට 4 ක අඩුවීමක් බව නිරීක්ෂණය විය.

ii. වවුචර්පත් වෙනුවෙන් බැංකු මගින් ගෙවන ලද මුදල හා මුද්‍රණ සහ ප්‍රචාරණ සඳහා වියදම්ද ඇතුළත් මුළු වියදම රු. 2,298,059,382 ක් වූ අතර, ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම (රු.) | ඒක ශිෂ්‍ය පිරිවැය (රු.) | ඒක ශිෂ්‍ය පිරිවැය 2015 ට වඩා වැඩිවීම (රු.) |
|---|---|---|---|---|
| 2016 | 4,342,381 | 2,298,059,382 | 529.22 | 74.98 |

මේ අනුව නිල ඇඳුම් රෙදි වෙනුවෙන් 2015 වර්ෂයේදී එක් ප්‍රතිලාභියකු වෙත වැයකර තිබුණු පිරිවැයට සාපේක්ෂව, වවුචර්පත් වෙනුවෙන් එක් ප්‍රතිලාභියකු වෙත වැයකර තිබුණු පිරිවැය රු. 74.98 කින් හෙවත් සියයට 16.51 කින් වැඩිවී තිබුණි.

iii. ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව නිල ඇඳුම් සඳහා රෙදි ලබාදීමේදී 2014 වර්ෂය වෙනුවෙන් වැයකර තිබුණු මුළු මුදල 2013 වර්ෂයට සාපේක්ෂව සියයට 38.77 කින් වැඩි වී තිබුණු අතර, 2015 වර්ෂයේදී 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 14.46 කින් අඩුවී තිබුණි. 2016 වර්ෂයේදී වවුචර්පත් බෙදා දීම වෙනුවෙන් වැය කර තිබුණු මුදල 2015 වර්ෂයේ නිල ඇඳුම් රෙදි වෙනුවෙන් වැයකර තිබුණු මුදලට වඩා සියයට 11.91 කින් වැඩිවී තිබුණි.

iv. නිල ඇඳුම් බෙදා දීමේ ක්‍රියාවලිය 2015 වර්ෂයේ සිට අවසන් කර ඇතත්, එම ක්‍රියාවලියට අදාල වූ ප්‍රශ්න නිරාකරණය කිරීමකින් තොරව වවුචර්පත් බෙදා දීමේ ක්‍රියාවලියට අවතීර්ණ වී තිබුණි. එසේ විසඳී නොතිබුණු ප්‍රශ්නවලින් කිහිපයක් පහත දැක්වේ.

- විගණනය වෙත ලබාදී තිබුණු තොරතුරු අනුව ගංවතුර හා නායයාම්වලදී බෙදාහැරීමෙන් අනතුරුව රු. 675,296,036 ක් වටිනා පාසල් සහ පිරිවෙන් සඳහා බෙදාදීමට සුදුසු නිල ඇඳුම් හා සිවුරු රෙදි පැකට් 2,683,716 ක් 2016 දෙසැම්බර් 31 දිනට ඔරුගොඩවත්ත ගබඩාවේ ඉතිරිව තිබුණි. මෙම තොගය තුළ 2015 වර්ෂය වෙනුවෙන්, 2016 පෙබරවාරි 26 දින ඔරුගොඩවත්ත නිල ඇඳුම් ගබඩාවට ලැබී තිබුණු රු. 26,670,992 ක් වටිනා ලොකු සිවුරු රෙදි පැකට් 16,400 ක්ද ඇතුලත් වී තිබුණි. සිවුරු රෙදි හැර අනෙක් නිල ඇඳුම් රෙදි මේ වන විට බෙදා අවසන් බව දන්වා තිබුණි.

- 2016 වර්ෂය වෙනුවෙන් පාසැල් හා පිරිවෙන් සිසුන් 4,342,381 ක් වෙත නිල ඇඳුම් සඳහා වවුචර්පත් බෙදාදීම 2016 පෙබරවාරි වන විට අවසන් වී තිබුණු අතර, 2016 පෙබරවාරි 26 දින වන විට ගබඩාවේ ඉතිරිව තිබුණු නිල ඇඳුම් හා සිවුරු රෙදි පැකට් ප්‍රමාණය 2,865,992 ක් විය. මේ තුල පිරිමි සිසුන් 817,757 ක් සඳහා කලිසම් හා කමිස රෙදිද, ගැහැණු සිසුන් 412,203 ක් සඳහා ගවුම් රෙදිද විය.

v. 2016 වර්ෂය සඳහා රු.2,616,569,960 ක් වටිනා වවුචර්පත් මුද්‍රණය කර තිබුණද කලාප කාර්යාලය හරහා පාසැල් වෙත නිකුත් කළ ප්‍රමාණයේ වටිනාකමරු. 2,414,076,750 ක් විය. ඒ අනුව රු. 202,493,210 ක් වටිනා වවුචර්පත් අමාත්‍යාංශයේ ඉතිරිව තිබුණි. නිකුත්කල වවුචර් සඳහා බැංකු මඟින් ගෙවන ලද මුදල රු. 2,267,609,204 වූයෙන් රු.146,467,546 ක් වටිනා වවුචර් කලාප කාර්යාල, ගුරුවරුන් හෝ ශිෂ්‍යයින් අතර රඳවාගෙන තිබුණි. සමස්ථයක් ලෙස 2016 වර්ෂය තුල මුද්‍රණය කළ සම්පූර්ණ වවුචර්වලින් රු. 348,960,756 ක් වටිනා වවුචර් ඉතිරිව තිබුණි.

vi. පාසල් සිසුන් වෙත වවුචර්පත් නොලැබීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් නොමැති බව අමාත්‍යාංශය විසින් දන්වා තිබු නමුත්, විගණන නියැදි පරීක්ෂණයට අනුව එක් පාසැලක වටිනාකම රු. 54,750 ක් වන බෙදා නොහල වවුචර්පත් 199 ක් තිබුණු බවත්, මෙවැනි තත්ත්වයන් හේතුවෙන් කලාප මට්ටමෙන් වවුචර්පත් බෙදාහැරීම නිසියාකාරව අධීක්ෂණය වී නොමැති බවත් නිරීක්ෂණය විය.

vii. සමස්ථ පාසැල් සිසුන් වෙනුවෙන් වවුචර්පත් බෙදාදීම අපේක්ෂිතව තිබුණු නමුත්, නිකුත්කළ වවුචර්පත් වලින් රු. 146,467,546 ක් වටිනා වවුචර්පත් බැංකුවලට ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් අදාල සිසු දරුවන්ගේ නිල ඇඳුම් අවශ්‍යතාවය අපේක්ෂිත පරිදි ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය.

(ඉ) අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය

--------------------------------------------------

ගුරු තොරතුරු ඇතුළත් දත්ත සංචිතයක් (Data Base) පිළියෙල කරගැනීම හා ඊට අනුබද්ධිත ගුරු සේවා කළමනාකරණය සහ ගුරුවරුන්ට හා කාර්යාල පද්ධතියට අවශ්‍ය සේවාවන් සැපයීම යනාදීවූ අරමුණු පෙරදැරිව, මොරටුව විශ්ව විද්‍යාලයේ සහයෝගය ඇතිව අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියක් ( EMIS ) ස්ථාපිත කර තිබුණු අතර, ඒ සඳහා 2011 මාර්තු මාසයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා වූ කාලය තුලදී දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘති ( EKSP ) අරමුදලින් වැය කර තිබුණු මුදල රු. 64,060,373 ක් විය.

2012 පෙබරවාරි 27 දින අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම අනුව රු. 900,000 (බදු රහිත) මුදලකට මෙහි පළමුවන පියවර යටතේ ගුරුවරුන් සඳහා වන දත්ත පද්ධතිය නිර්මාණය කර දීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලය වෙත භාර දී තිබුණි.

2013 ජුනි 27 දින අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම අනුව දෙවන පියවර යටතේ පළමුවන පියවරෙහි සඳහන් දත්ත පාදක කරගෙන මොඩියුල නවයක් නිර්මාණය කර ලබාදීමට එකඟ වී තිබුණු අතර, ඒ සඳහා රු. 13,877,100 (බදු රහිත) මුදලක් මොරටුව විශ්ව විද්‍යාලය වෙත ගෙවා තිබුණි.

දැනට වසර හතරකටත් වඩා පැරණි මෙම පද්ධතිය නියමාකාරයෙන් ක්‍රියාත්මක කිරීමට 2017 ජුනි 30 දින දක්වාත් අපහසුවී තිබුණු අතර, තාක්ෂණික කටයුතු භාරව සිටින විශේෂඥයින් වශයෙන් මෙම ව්‍යාපෘතියේ වගකීම භාරව කටයුතු කරන නිළධාරීන්ගේ මැදිහත්වීම අල්ප බව හා ප්‍රමාද බව මීට හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

(ඊ) පාසැල් පෙළපොත් මුද්‍රණය හා බෙදාහැරීම

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් 2017 වසරේදී පෙළපොත් මුද්‍රණය සඳහා දරා තිබුණු වියදම රු. මිලියන 3,888 ක් විය. පොත් වර්ග 315 කින් පිටපත් 30,033,000 ක් මුද්‍රණය කිරීම සඳහා ඉන් රු. මිලියන 2,985 ක් පෞද්ගලික මුද්‍රණාල

22 ක් වෙත ලබාදී තිබුණු අතර, එය මුළු මුද්‍රණ වියදමෙන් සියයට 77 ක් වන බව විගණනයේදී නිරීක්ෂණය විය.

ii. කෘතිම කඩදාසියෙන් පෙළපොත් මුද්‍රණය කිරීමේ නියමු ව්‍යාපෘතිය

---

මෙම ව්‍යාපෘතිය සඳහා 2016 ජුනි 20 දිනැති අංක 2016/ED/E/22 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා තිබුණු අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණේ ඊට අදාළ කොන්දේසිවලට යටත්ව විය. ඒ සඳහා මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබුණු නිරීක්ෂණ සම්බන්ධයෙන් අවධානය යොමුකර ශක්‍යතා අධ්‍යයනයක් සිදුකළ යුතුව තිබුණ නමුත්, ශක්‍යතා අධ්‍යයනයේදී එම නිරීක්ෂණ සම්බන්ධයෙන් අවධානය යොමු කළ බවට සාක්ෂි විගණනයේදී නිරීක්ෂණය නොවීය.එවැනි අවස්ථා පහත දැක්වේ.

- පිටු 200 ක පෙළපොතක් මුද්‍රණය කිරීම සඳහා වන ඒකක පිරිවැය රු. 320 ක් වන බව සඳහන් කර තිබුණද, පිටු 83 ක පොතක් සඳහා සත්‍ය බදු රහිත මිල රු. 305.55 ක් වී තිබුණි.
- දැනටපවතිනපෙළපොත්වෙනුවටමෙවැනිකෘතිමකඩදාසියෙන් පෙළපොත් භාවිතා කිරීමට ඇති අවශ්‍යතාවය පිළිබඳව ඉල්ලීමක් හෝ අවශ්‍යතාවයක් ඉදිරිපත් කර තිබුණු බවට සාක්ෂි ශක්‍යතා අධ්‍යයන වාර්තාවලින් අනාවරණය නොවීය.
- දැනටපවතිනපෙළපොත්වලගුණාත්මකභාවයසහකල්පැවැත්මසම්බන්ධයෙන්පැමිණිලිවාර්තාවී තිබේදයන්නසොයාබැලියයුතු බව සඳහන් කර තිබුණද, එවැනි අධ්‍යයනයක් සිදුකර තිබුණු බවට හෝ ගුණාත්මකභාවය හා කල්පැවැත්ම සම්බන්ධ පැමිණිලි ඉදිරිපත් වී තිබුණු බවට සාක්ෂි නොවීය.
- කෘතිමකඩදාසිභාවිතයේදීඇතිවියහැකිපාරිසරිකබලපෑම්සහභාවිතාකරනලද පෙළපොත්බැහැරකිරීමේක්‍රමවේදය පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරිය සමඟ සාකච්ඡා කළයුතු බව මුදල් ඇමතිවරයා විසින් ශක්‍යතා අධ්‍යයනයේදී සිදුකළ යුතු කාර්යයක් ලෙස පෙන්වා දී තිබුණු නමුත් භාවිතයෙන් පසු මෙම පෙළපොත් බැහැර කිරීම සඳහා පවතින ක්‍රමවේදයන් මොනවාද යන්න ශක්‍යතා අධ්‍යනයේදී අවසන් නිගමනයකට එළඹ තිබුණු බවට සාක්ෂි නිරීක්ෂණය නොවීය.

➢ 7 ශ්‍රේණිය සඳහා භූගෝල විද්‍යාව පොත මුද්‍රණය කිරීම

---------------------------------------------------------

7 ශ්‍රේණිය භූගෝල විද්‍යාව පොතක් මුද්‍රණය කිරීම සඳහා එක් පොතක බදු රහිත මිල වශයෙන්, පහත සඳහන් අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.

| පොත | මිල ගණන් සාමාන්‍යකඩදාසි (2016 ජුනි 16 දින කැඳවා තිබූ මිල ගණන් අනුව) | කෘතිමකඩදාසි (2016 දෙසැම්බර් 06 දින කැඳවා තිබූ මිල ගණන් අනුව) | වෙනස | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | ප්‍රතිශතය |
| සිංහල මාධ්‍යය | 45.69 | 305.55 | 259.86 | 568.75 |
| දෙමල මාධ්‍යය | 69.52 | 317.00 | 247.48 | 355.98 |
| ඉංග්‍රීසිමාධ්‍යය | 43.54 | 290.00 | 246.46 | 566.05 |

- මේ අනුව බලන කල කෘතිම කඩදාසියෙන් එක් පොතක් මුද්‍රණය කිරීම වෙනුවෙන් දරන පිරිවැය සාමාන්‍ය කඩදාසියෙන් එක් පොතක් මුද්‍රණය කිරීමේදී දරන පිරිවැයට සාපේක්ෂව සියයට 356 සිට සියයට 569 ක් දක්වා පරාසයක වූ ඉතා අධික පිරිවැයක පැවතුණි.
- පළමුමුද්‍රණයෙන් පසු මුද්‍රණවියදමේවෙනසරු. 128,939,700 ක් වූ අතර, එය මෙම පොත කෘතිම කඩදාසියෙන් මුද්‍රණය කිරීම හේතුවෙන් රජයට දැරීමට සිදුවන අතිරේක පිරිවැයක් හෝ අලාභයක් ලෙස නිරීක්ෂණය විය.විස්තර පහත දැක්වේ.

| මාධ්‍යය | පොත් සංඛ්‍යාව | කෘතිම කඩදාසියෙන් පොතක මිල (රු.) | කෘතිම කඩදාසියෙන් මුළු වටිනාකම (රු.) | සාමාන්‍ය කඩදාසියෙන් පොතක මිල (රු.) | සාමාන්‍ය කඩදාසියෙන් මුළු වටිනාකම (රු.) | වෙනස පොතක මිල (රු.) | වෙනස මුළු වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| සිංහල | 325,000 | 305.55 | 99,303,750 | 45.69 | 14,849,250 | 259.86 | 84,454,500 |
| දෙමළ | 120,000 | 317.00 | 38,040,000 | 69.52 | 8,342,400 | 247.48 | 29,697,600 |
| ඉංග්‍රීසි | 60,000 | 290.00 | 17,400,000 | 43.54 | 2,612,400 | 246.46 | 14,787,600 |
| | | | 154,743,750 | | 25,804,050 | | 128,939,700 |

3.17 ප්‍රසම්පාදන

-------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කොළඹ විසාකා විද්‍යාලයේ සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු. මිලියන 97 කට කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන තිබුණි. එම ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් වන මුළු වියදම පියවා ගැනීම සඳහා අදාල විද්‍යාලයේ පාසැල් සංවර්ධන ගිණුම් හා ස්ථාවර තැන්පතුවල රු. මිලියන 137 ක් පවතින බව විදුහල්පතිනිය දන්වා තිබුණි. ඒ අනුව තවදුරටත් රුපියල් මිලියන 40 ක් වැනි මුදලක් පාසැලට ඉතිරි කරගත හැකිව තිබුණු නමුත්, අමාත්‍යාංශයේ 2017 අයවැය ඇස්තමේන්තුවලද එම ඉදිකිරීම් වෙනුවෙන් රු. මිලියන 63.5 ක මුදලක් ඇතුලත් කර තිබුණ අතර, එම මුදල් උපකරණ මිලදී ගැනීම සඳහා වන බව දන්වා තිබුණි.

(ආ) නුගේගොඩඅනුලා විද්‍යාලයේ ශ්‍රවණාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා තුන්වන කොන්ත්‍රාත්කරු වෙත 2010 නොවැම්බර් 19 දින වටිනාකම (වැට් රහිත) රු. 14,008,988 ක් වූ කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව ඉදිකිරීම් කටයුතු 2010 නොවැම්බර් 17 දින ආරම්භ කර 2011 ජුනි 1 දින අවසන් කළයුතුව තිබුණු අතර, අවස්ථා කිහිපයකදීම දින දීර්ඝ කිරීම්ද සිදු කර තිබුණි. එසේ වුවද, වැඩ අවසන් කර නොතිබුණු අතර, කළ වැඩවල වටිනාකම රු. 8,098,360 ක් වී තිබුණි. අදාල විද්‍යාලයෙන් මේ සඳහා රු.25,600,000 ක මුදලක් අමාත්‍යාංශයේ තැන්පත් කර තිබුණු අතර, ඉන් රු. 17,364,881 ක් රජයේ ආදායමට බැර කර තිබුණි. වසර දහයකට අධික කාලයක් ගතවී තිබුණද ඉදිකිරීම් අවසන් කර නොතිබුණු අතර, ප්‍රමාදය හේතුවෙන් ද්‍රව්‍යවල මිල විචලනයන්ගෙන් වන අලාභයන්ට හා ඉදිකරන ලද කොටස්වලට වන හානිවලින් සිදුවන අලාභයන්ට අදාල නිලධාරීන් වගකීමට බැඳෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) කිරුලපන ඉසිපතන විද්‍යාලයේ පිහිනුම් තටාකයක් ඉදිකිරීම සඳහා රු. 43,400,503 ක කොන්ත්‍රාත්තුවක් සළකා කොන්ත්‍රාත්කරුවකු සමඟ ගිවිසුම් ගතවී තිබුණි. 2014 ජුලි 29 දින වැඩ ආරම්භ කර දින 280 කින් අවසන් කළ යුතුව තිබුණු නමුත්, 2016 ඔක්තෝබර් 11 දින දක්වාද දීර්ඝ කිරීම් ලබාදී තිබුණි. කරන ලද වැඩවල මුළු වටිනාකම රු. 33,035,295 ක මුදල අදාල කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට කටයුතු කර තිබුණු අතර, ප්‍රමාද කාලය වෙනුවෙන් කිසිදු අයකිරීමක් සිදුකළ බවට සාක්ෂි නිරීක්ෂණය නොවීය.

(ඈ) 2016 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම අනුව රුපියල් මිලියන 7,227.6 ක ඇස්තමේන්තු සකස් කර තිබුණද, සංශෝධිතසැලැස්ම අනුව එය රුපියල් මිලියන 4,681.36 ක් වන බවද,වර්ෂය තුල ප්‍රසම්පාදන සඳහා වැයකර තිබුණේ රු. මිලියන 1,854.3 ක් පමණක් වූ නමුත් 2015 හා 2016 වෙනුවෙන් රුපියල් මිලියන 2,315.35 ක බැරකම් වෙනුවෙන් වැය වන බවද දන්වා තිබුණි.

3.18 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

---------------------------------------------------

ව්‍යාපෘති ආරම්භ නොකිරීම පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථාවක් පහත දැක්වේ.

(අ) පිහිනුම් තටාකයක් ඉදිකිරීමේ අරමුදලක් සඳහා කොළඹ මහානාම පිරිමි ජාතික පාසැල විසින් එකතු කරන ලද රු. 6,000,000 ක මුදලක් 2007 දෙසැම්බර් 19 දින ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණු අතර, 2016 දෙසැම්බර් 31 දින වන විට එම ආයෝජනයේ වටිනාකම රු. 22,532,809 ක් වී තිබුණි. කෙසේ වෙතත්, 2017 ජූලි 21 දින දක්වාද අදාල පිහිණුම් තටාකය ඉදිකිරීමට අදාල කටයුතු ආරම්භ කර හෝ නොතිබුණි.

3.19 වාහන උපයෝජනය

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධ්‍යාපන අමාත්‍යාංශය සතුව සියළුම වර්ගයන්ට අයත් වාහන 147 ක් පැවති අතර, ඉන් 17 ක් භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවතුණි. එයින්, වාහන 71 ක් අධ්‍යාපන අමාත්‍යාංශයේ හිමිකාරීත්වය තිබුණද අමාත්‍යාංශයේ නොතිබුණු අතර, අමාත්‍යාංශයට අයත් නොවූ වාහන 25 ක් අමාත්‍යාංශයේ භාවිතයට යොදවා තිබුණි.

(ආ) 2016 වසරේදී අමාත්‍යාංශයේ වාහන අනතුරු 24 ක් ඇති වී තිබුණි. ඒවා සම්බන්ධයෙන් මු.රෙ.104(4) පරීක්ෂණ අවසන් වූ පසුව, එම නිර්දේශ අනුව කටයුතු කරන බව දන්වා තිබුණි.

3.20 මානව සම්පත් කළමනාකරණය

(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2016 දෙසැම්බර් 31 දිනට විගණනය වෙත ඉදිරිපත් කර තිබුණුතොරතුරු අනුව සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 2,636 | 1019 | 1617 | - |
| (ii) | තෘතියික මට්ටම | 56,371 | 35743 | 20,629 | 1 |
| (iii) | ද්විතියික මට්ටම | 647 | 714 | 38 | 105 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 267 | 238 | 30 | 1 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 03 | 01 | 02 | - |
| | එකතුව | 59,924 | 37,715 | 22,316 | 107 |

(ආ) පත්කිරීම්, උසස් කිරීම්, වැටුප් ගෙවීම

i. රාජ්‍ය සේවයේ වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා නිකුත් කළ 2006 අප්‍රේල් 25 දිනැති 06/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුමIII හි සඳහන් සටහන හා 2006 නොවැම්බර් 10 දිනැති 06/2006 (II) හි 04 ඡේදයට අනුකූල නොවන පරිදි 2006 ජනවාරි 01 දිනට පසුව අමාත්‍යාංශයේ ජාතික පාසැල්, විද්‍යාපීඨ හා ගුරු විද්‍යාල සඳහා බඳවාගෙන තිබුණු රසායනාගාර සේවක හා පුස්තකාල සේවක හා පුස්තකාල සේවකයින් අදාළ තනතුරුවල III ශ්‍රේණියෙහි තබා, වැටුප් පරිමාණයේ ආරම්භක පියවරෙහි තැබිය යුතු වුවද,II ශ්‍රේණියෙහි තබා 12 වන වැටුප් පියවර

ලබාදී තිබුණු අතර, මුරකරු හා ගිලන්හල් සේවක තනතුරු සඳහාද ආරම්භක වැටුප් පියවර වෙනුවට 12 වන වැටුප් පියවර ලබාදී තිබුණි.

ii. 2007 ජුලි 01 සිට 2009 නොවැම්බර් 01 දක්වා කාලසීමාව තුල අනියම් සේවක තනතුරු 324 ක් සඳහා පත්වීම් ලබාදී තිබුණු අතර, 2016 වර්ෂය අවසානය වන විට වැඩිපුර ගෙවා ඇති වැටුප දළ වශයෙන් (වැටුප් වර්ධක රහිතව) රු. 46,608,520 ක් පමණ වී තිබුණි.

iii. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම්ගේ 2010 නොවැම්බර් 10 දිනැති අංක NSCC/1/84/TU – 2 දරන ලිපියෙන්, 2008 දෙසැම්බර් 04, 2009 ජනවාරි 06 හා 2009 මැයි 18 දිනැති ලිපිවලින් කොමිෂන් සභාවේ උපදෙස් අමාත්‍යාංශය වෙත එවා තිබුණද, ඒ අනුව කටයුතු නොකරමින් නව පත්වීම් ලබාදෙන බව 2009 ජුනි 30 දිනැති අංක ED/5/67/11/20 දරන පත්වීම් ලිපියෙන් පැහැදිලි වන බවත්, එම තත්ත්වය වහාම නිවැරදි කළයුතු බවත්, 2006 ජනවාරි 01 දිනෙන් පසුව බඳවාගත් සේවකයින් නිවැරදි වැටුප් ක්‍රමයේ පිහිටුවන ලෙසත් හා මෙකී සාවද්‍ය තීරණයෙන් ගෙවීමට සිදුවූ වැඩි වැටුප් මුදල් අදාල නියෝග ලබාදුන් නිලධාරීන්ගෙන් අධිභාර ලෙස අයකර ගැනීමට කටයුතු කරන ලෙසත්, නිර්දේශ කර තිබුණු අතර, ඒ සඳහා ගනු ලබන පියවර පිළිබඳව කොමිෂන් සභාව හා විගණකාධිපතිව දැනුවත් කරන ලෙසද සඳහන් කර තිබුණි. කෙසේ වුවත්, එවැනි දැනුවත් කිරීමක් කළ බව තහවුරු නොවුණි.

(ඇ) 2009පෙබරවාරි 20දිනැති අංක 1589/30දරන (අතිවිශේෂ) ගැසට් පත්‍රයේ පළකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති xviii පරිච්ඡේදයේ 193වන කොන්දේසිය අනුව සෑම රජයේ නිලධාරියෙක්ම ස්ථාන මාරුකිරීම්වලට යටත් වන අතර,එහි ස්ථාන මාරුවීම්වලට හා ආයතන සංග්‍රහයේ IIIපරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූල නොවන අයුරින් ක්‍රියා කරමින් අධ්‍යාපන අමාත්‍යාංශය තුල සේවයේ නියුතු අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කර නොතිබුණි. එසේ වසර 05 කට වඩා වැඩි කාලයක් සේවයේ යෙදී සිටි නිලධාරීන්ගේ විස්තර පහත සඳහන් වේ.

| සේවය | නිලධාරීන් ගණන | කාලය (අවුරුදු) | අමාත්‍යාංශයට සේවයට පැමිණි කාලය |
|---|---|---|---|
| ------- | --------- | ---------------- | -------------- |
| අධ්‍යාපන පරිපාලන | තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | | |
| ශ්‍රී ලංකා පරිපාලන සේවය | 03 | 4 සිට 5 දක්වා | 2011/2012 |
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 04 | 5 සිට 17 දක්වා | 2000/2012 |
| ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 02 | 11 කට වැඩි | 2006/2007 |
| ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | 08 | 5 සිට 23 දක්වා | 1993/2012 |
| රාජ්‍ය කළමනාකරණ සේවය (I) | 12 | 5 සිට 7 දක්වා | 2009/2012 |
| රාජ්‍ය කළමනාකරණ සේවය (II) | 16 | 4 සිට 8 දක්වා | 2008/2012 |
| රාජ්‍ය කළමනාකරණ සේවය (III) | 05 | 4 සිට 6 දක්වා | 2010/2012 |
| සංවර්ධන සහකාර නිලධාරීන් | 96 | 11 කට වැඩි | 2005/2017 |
| ලේඛන සහකාර නිලධාරීන් | 45 | 16 කට වැඩි | 2000/2016 |
| මූල්‍ය සහකාර | 12 | 11 කට වැඩි | 2005/2016 |